# කුර්ආනය සහ නූතන විද්‍යාව

ආචාර්ය මොරිස් බුබෙයිල්
ප්‍රංශ වෛද්‍ය විද්‍යා ඇකඩමිය

المكتب التعاوني للدعوة والارشاد وتوعية الجاليات بالبديعة
تحت اشراف وزارة الشؤون الإسلامية و الاوقاف والدعوة و الارشاد
ص.ب ٢٤٩٣٢ الرياض ١١٤٥٦- هاتف ٤٣٣٠٨٨٨ - فاكس ٤٣٠١١٢٢

# කුර්ආනය සහ නූතන විද්‍යාව


ආචාර්ය මොරිස් බුබෙයිල්

ප්‍රංශ වෛද්‍ය විද්‍යා ඇකඩමිය



MUSLIM EDUCATIONAL SOCIETY

"DISCOVER ISLAM"

ඩිස්කවර් ඉස්ලාම් බහ්රේන්

# පටුන


| | |
|---|---|
| පෙරවදන | |
| හැඳින්වීම | 1 |
| ආගම හා විද්‍යාව | 3 |
| කුර්ආනය හා විද්‍යාව | 5 |
| කුර්ආනයේ චලංගුභාවය | 8 |
| විශ්වයේ මැවීම | 12 |
| තාරකා විද්‍යාව | 15 |
| භූගර්භ විද්‍යාව | 20 |
| ජීව විද්‍යාව | 24 |
| කළල විද්‍යාව - (Embryology) | 28 |
| බයිබලය කුර්ආනය සහ විද්‍යාව | 34 |
| පසුවදන | 41 |

# පෙරවදන

වෛද්‍ය මොරිස් බුබේයිල් විසින් රචිත මෙම පොත, පුරා වසර 19ක කාලයක් මුළුල්ලෙහි, මුස්ලිම් නොවූවනට ඉස්ලාමය ගැන කරුණු ඉදිරිපත් කිරීමෙහි ලාත්, මුස්ලිම් වරුනට කුර්ආනයේ ඇති විද්‍යාත්මක කරුණු හඳුන්වාදීමටත් ඉතා අගනා මෙහෙවරක යෙදුණි. මෙම පොත සැකසී ඇත්තේ වෛද්‍ය මොරිස් බුබෙයිල් විසින් ප්‍රංශ බසින් කරන ලද දේශණයක් ඇසුරිනි.

දෙවියන් වහන්සේගේ අවසාන දේව පණිවුඩය ලෙස හෙළිදරව් වූ කුර්ආනය, සාමාන්‍ය මිනිසා අතරට ගෙන ඒමේ කර්තව්‍යයේදී මෙම පොත මගින් සැලසෙන සුළු පිටුවහල ඉතා අනගි සේවයකට මුලපුරන, තිසි මහ පාදා දෙන්නක් වනු ඇතැයි අපි අපේක්ෂා කරමු.

**සියළුම ප්‍රශන්සා සර්වබලධාරී "අල්ලාහ්ට හිමි වේවා**

නජමා පෙරේරා

**ජුලි 1999** **ඩිස්කවර් ඉස්ලාම්**
**බහ්රේන්**

# හැඳින්වීම

1976 නොවැම්බර් මස 9 වැනිදින, නුහුරු - නුපුරුදු ආකාරයේ අමුතුම දේශණයක් ප්‍රංශ විද්‍යා ඇකඩමියේදී ම විසින් පවත්වන ලදී. එහි තේමාව වූයේ "කුර්ආනයේ එන කායික විද්‍යාත්මක හා කළල විද්‍යාත්මක දත්ත" යන්නයි. මෙම දේශණය මවිසින් පත්වන ලද්දේ කුර්ආනයේ එන ප්‍රජනනය හා කායික විද්‍යාව පිළිබඳව වූ කරුණු පාදක කරගෙනය. මෙම දේශණය පැවැත්වීමට මට සිත්වූයේ: "හත්වැනි ශතවර්ෂය තරම් ඈත යුගයෙක බිහිවූ ග්‍රන්ථයක, නූතන යුගයේදී පමණක් සොයාගනු ලැබූ කරුණු විශාල ප්‍රමාණයක් අන්තර්ගතවූයේ කෙසේද යන්න," මා අතිශයින්ම මවිතයට පත්කළ සිද්ධියක් වූ බැවිනි.

ප්‍රථම වතාවට වෛද්‍ය සමාජයක, උගත් සාමාජිකයින් හමුවේ, ඔවුනට හොඳින් හුරුපුරුදු විෂයයක් අල්ලා මා මෙම දේශණය පැවත්වූවද, කුර්ආනයේ අනෙකුත් බොහෝ විවිධ විෂය ක්ෂේත්‍රයන් හා සම්බන්ධ ඉතා වැදගත් විද්‍යාත්මක කරුණු අන්තර්ගත වන අයුරින් මෙම දේශණය පැවැත්වීම පහසුවිය. උදහරණයක් ලෙස තාරකා විද්‍යාඥයින්, සත්ත්ව විද්‍යා විශේෂඥයින්, භූගර්භ විද්‍යාඥයින් සහ අනෙකුත් විවිධ ක්ෂේත්‍රවල නිපුණ විශේෂඥයින්, කුර්ආණයේ එන ඉතා නිවැරදි, ස්වභාව සිද්ධාන්ත විග්‍රහයන් කියවීමෙන්, මගේ සහෝදර වෛද්‍යවරුන් මා මෙන්ම මවිතයෙන් මවිතයට පත්වනු මම දුටුවෙමි. මෙලෙස විද්‍යාවේ ඉතිහාසය හා සංසන්දනාත්මකව බලන කළ, කුර්ආනයේ එන විශ්මිත හුවා දැක්වීම් මගින් අප යොමුකරවන නිගමනය වනුයේ, මිනිසාගේ තාර්කික විග්‍රහයනට කුර්ආනය මගින් පැහැදිලි අභියෝගයක් එල්ල කර ඇති බවයි.

කුර්ආනය ලොව පහල වූ අවධියේ පැවැති මිනිස් දැනුම මට්ටමට වඩා හාත්පසින්ම ඔබ්බට විහිදුණු තාර්කික කරුණු රැගත් මෙම ග්‍රන්ථය මිනිස් නිර්මාණයක් බවට කිසි ලෙසකින් හෝ අපට

දැක්විය නොහැක. කුර්ආනයේ එන බොහෝ විද්‍යාත්මක කරුණු මිනිසා විසින් ඉතා මෑතකදී ලබාගත් නව දැනුම මත පමණක් පදනම් වූ ඒවාය. යුරෝපයේ පවතින විවිධ භාෂාවන් වලට පරිවර්තනය කර ඇති කුර්ආනීය සංස්කරණයන්හි එන විස්තර විග්‍රහයන්ගේ පවා, මෙම කරුණු සම්බන්ධයෙන් පළවී ඇත්තේ විසුරුණු, නොපැහැදිලි අදහස් හා අසම්පූර්ණ අර්ථ කථනයන් පමණි. එසේම අරාබි බසින්ම කුර්-ආනය පිළිබඳව විග්‍රහයන්ගෙහි යෙදෙන්නන් පවා එහි එන විද්‍යාත්මක කරුණු පිළිබඳව සම්පූර්ණ අධ්‍යයනයක යෙදී නොමැත. මෙම හේතුන් පදනම් කරගෙන 'කුර්ආනය සම්බන්ධ පුළුල් හා සම්පූර්ණ අධ්‍යයනයක යෙදිය යුතුය' යන අදහස මා සිත පහළ විය.

තවද බයිබලයෙහි එන (ශුභාරංචිය හා පැරණි තෙස්තමේන්තුවෙහි) කරුණුද මේ සමඟම සංසන්දනාත්මකව සලකා බැලීම උචිත යැයි මට හැඟුණි. මේ අනුව එක් එක් ඒකදේවවාදී ආගමික ග්‍රන්ථයන්හි එන කරුණු නූතන විද්‍යාත්මක දැනුම හා සංසන්දනය කිරීමේ පර්යේෂණ ව්‍යාපෘතියක් ආරම්භ කෙරුණි. එම ව්‍යාපෘතියේ ප්‍රතිඵලය ලෙස 'බයිබලය, කුර්ආනය හා නූතන විද්‍යාව' නම් පොත එළිදැක්වුණි. මෙහි පළමු ප්‍රංශ භාෂා මුද්‍රණය 1976 මැයි මසද, ඉන්පසු ඉංග්‍රීසි හා අරාබි භාෂා පරිවර්තන ද මේ දක්වා මුද්‍රණය වී ඇත.

- **වෛද්‍ය මොරිස් බුකායිල්** -

# ආගම සහ විද්‍යාව

ඉස්ලාමය හා විද්‍යාව අතර ඇති ඉතා කිට්ටු සම්බන්ධය හුවා දැක්වීමට මුහම්මද් නබිතුමාගේ (සල්) නිරන්තර දේශණාවලින් උපුටාගත් පහත සඳහන් කොටස් තරම් යෝග්‍ය වූ නිදර්ශණයන් තවත් නොතිබිය හැකැයි මම සිතමි.

*"දැනුම සෙවීම සෑම මුස්ලිමයෙකුටම අනිවාර්‍ය වේ"*

*"ඥාණය යනු විශ්වාසවන්තයාගේ නැතිවුණු වස්තුව වේ"*

*"දැනුම සෙවීමේ මාර්ගයේ ගමන් කරන ඕනෑම අයෙකුට අල්ලාහ් විසින් ස්වර්ගයට යන මාර්ගය පහසු කරනු ඇත."*

මෙම වගන්තීන් සහ නොයෙකුත් අන්‍ය උපදේශයන් හැකි සියළුම මාර්ගවලින් දැනුම රැස්කිරීමේ හා වැඩිදියුණු කිරීමෙහි යෙදීමට මිනිසාට කෙරෙන විවෘත, සත්‍ය ආරාධනාවන් බඳුවේ. එබැවින් ඉස්ලාම් දහම සහ විද්‍යාව නිවුන් සොහොයුරියන් ලෙස දැක්වීම පුදුමයට කරුණක් නොවේ. වත්මන් යුගයේදී විද්‍යාව, විවිධ ආගම් වලින් පිටු පැනීමට නොයෙක් උත්සාහයන් දැරුවද තවමත් එය ඉස්ලාමය හා අඛණ්ඩව එකට සබැඳී පවතී. තවද කුර්ආනයේ එන ඇතැම් කරුණු වඩා හොඳින් අවබෝධ කරගැනීම සඳහා නූතන විද්‍යාත්මක දත්තයන්ගෙන් ලැබෙන සහායද සැබැවින්ම අපූරුය. විද්‍යාත්මක සත්‍යයන් තුළින් ආගමික විශ්වාසයන් බිඳ දමමින් ඒවාට මරුපහර එල්ල කරන යුගයක, විද්‍යාව මගින් අනාවරණය කරගත් නිවැරදි දත්ත ඉස්ලාමීය ග්‍රන්ථයන් හා පරීක්ෂණයට භාජනය කිරීමෙන් මිනිසා වටහා ගනු ලැබූයේ, කුර්ආනයෙහි ඇති දිව්‍යමය පණිවිඩයෙහි විද්‍යාමාන වන නිවැරදි හා සත්‍ය වූ ස්වභාවය පිළිබඳවය.

බොහෝ මිනිසුන් කියන හෝ සිතන ආකාරයට නොව, අවසාන වශයෙන් විද්‍යාත්මක දැනුම මගින් අපට පෙන්වා දෙනු ලබනුයේ දෙවියන්ගේ පැවැත්ම පිළිබඳව ප්‍රබල සාධකයන් අප අතර ඇති බවය. නූතන දැනුම තුළින් හෙළිදැක්වෙන අභිධර්මීය පාඩම් සහ ආදර්ශයන් ගැන (අධ්‍යාත්මික විද්‍යාව හා සම්බන්ධ) අප ඉතා

සාධාරණව හා අපක්ෂපාතීව අපෙන්ම විමසා බැලුවහොත් දෙවියකු ඇතැයි සිතීමට බොහෝ හේතු සාධක පවතින බව අපට නිසැකවම අවබෝධ වනු ඇත. (උදාහරණයක් වශයෙන් පදර්ථයේ අඩංගු කුඩාම සංඝටකය පිළිබඳව අප සතු ක්‍රමයෙන් විකාශයට පත්වන දැනුම, හෝ අජීව ද්‍රව්‍යවලින් ජීවය ඇතිවීම වටා ගොඩනැඟී ඇති ප්‍රශ්න සලකා බැලිය හැක.) ඕනෑම ජීවියෙක් උපතේ සිට ජීවිතය පවත්වා ගෙන යාමේදී හමුවන නොයෙක් පියවරවල පවතින පැහැදිලි, කැපී පෙනෙන සංවිධානාත්මක බව හා පාලනය ගැන සලකා බලන කල, එය අහම්බෙන් ඇතිවූවක් බව පැවසීමට ඇති කරුණු සීමිතය.

අද විවිධ ක්ෂේත්‍රයන්හි ඇතිවී ඇති විද්‍යාත්මක දැනුමේ පුළුල්වීම හේතු කොටගෙන අතීතයේ අපතුළ වූ බොහෝ මතවාද බිඳ වැටීයාම ක්‍රමක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. උදහරණයක් වශයෙන් මෑතකදී බිඳ වැටුණු, වෛද්‍ය විද්‍යාව පිළිබඳ නොබෙල් ත්‍යාග ලාභී ප්‍රංශ විද්‍යාඥයෙකු විසින් 'ජීවීන් අජීව ද්‍රව්‍ය තුළ වූ සරල රසායනික මූලද්‍රව්‍යයන්ගෙන් අහඹු ලෙස ඇතිවන බවට ස්ථිරවම ප්‍රකාශ කල අජීවෝත්ජනන වාදය' (ස්වයං සිද්ධ ජනනය) දැක්විය හැක. මෙලෙස ඉතා සරල ලෙස ජීවය සම්භවය වූයේ නම්, එහි වැඩිදුර විකාශයක් ලෙස කැපීපෙනෙන ලෙස ඉතා සංකීර්ණ වූ මිනිසා බිහිවී ඇතැයි කෙනෙකුට පැවසිය හැක. මගේ වැටහීමට අනුව නම් විද්‍යාවේ දියුණුව මගින් උසස් ජීවීන්ගේ සංකීර්ණභාවය වටහාගැනීමෙන් ඉදිරිපත් කෙරෙනුයේ මීට ප්‍රතිවිරුද්ධ වූ න්‍යායක් බවයි. එනම් ජීව සිද්ධාන්තයන්ගේ කැපීපෙනෙන සැකැස්ම, පාලනය හා අපූර්ව විධිමත් සංවිධානය ගැන සලකා බලන කල, ඒ සඳහා මැවුම්කරුවෙකු නියත වශයෙන්ම සිටිය යුතු බවයි.

කුර්ආනයේ එන බොහෝ කොටස් වල මෙබඳු පොදු සාමාන්‍ය අදහස් ගෙනහැර දක්වන නමුදු, නූතන විද්‍යාව මගින් අද නිරාවරණය කරගන්නා බොහෝ කරුණු, ඍජුව නිවැරදිව හා පැහැදිලිව කුර්ආනයෙහි අන්තර්ගත වේ. කුර්ආනයේ එන මෙම නිවැරදි දත්තයන් මගින් අද බොහෝ විද්‍යාඥයින් ඒ තුළට, කාන්දමක් වෙතට ලෝහයන් ඇදී යන්නාක් මෙන් ආකර්ෂණය වී ඇත.

# කුර්ආනය සහ විද්‍යාව

කුර්ආනය බිහිවීමෙන් ශත වර්ෂ ගණනාවක් පසුවන තුරුත්, එහි අන්තර්ගත බොහෝ වැකි පිළිබඳව අවබෝධ කරගැනීමට මිනිසා අපොහොසත් විය. එයට හේතුව එකල මිනිසුන් සතුව ඒවා තේරුම් ගැනීමට සෑහෙන තරම් විද්‍යාත්මක දැනුමක් නොතිබීමයි. ස්වභාවික සිද්ධාන්තයන් පිළිබඳව කුර්ආනයේ එන බොහෝ දෑ තේරුම් බේරුම් කරගත හැකි තත්ත්වයක විස්තර විචාරයන් ඉදිරිපත් කරන ලද්දේ ඉතා මෑතකදීය. කුර්ආනයේ එන පැරණි විස්තර විචාරයන් කියවීමෙන් තහවුරු වනුයේ, එකල එම සංස්කාරක වරුන් කෙබඳු මට්ටමක දැනුමකින් යුතු වූවන්ද යන්නය. ඔවුන් කුර්ආනයේ අඩංගු බොහෝ වැකිවල තිසි ගැඹුරු අර්ථය වටහා ගැනීමට සම්පූර්ණයෙන්ම අපොහොසත් වූ බව මෙයින් පෙනී යයි. එසේම විසිවන ශතවර්ෂයේ අගභාගය වන අද කාලයේදී පවා, විද්‍යාවේ ඇති අති උත්කෘෂ්ඨ දියුණුව තුළින් වුවද, සාමාන්‍ය විද්‍යාඥයකු හට කුර්ආනයේ එන විෂයයන්, විශේෂිත වූ ගවේෂණයකින් තොරව වටහා ගැනීමට පහසු නොවන්නකි. මෙයින් පැහැදිලි වනුයේ කුර්ආනයේ එන සියළුම වාක්‍යයන් හරිහැටි තේරුම් ගැනීමට නම්, අද දවසේ පවා, ඉතා හොඳ පුහුණු, විද්‍යාත්මක, විශ්වකෝෂ ඥාණයක් යමෙකුට අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතු බවයි.

මවිසින් මෙහිදී 'විද්‍යාව' යනුවෙන් අර්ථ දක්වනුයේ, බැලූ බැල්මටම ඉතා සරල, සාමාන්‍ය අර්ථ කථනයක් වූ 'දැනුම' යන්නයි. එයට මතවාදයන් අඩංගු නොවේ. මක්නිසාදයත් කිසියම් සිද්ධාන්තයක් හෝ සිද්ධාන්ත සමූහයක් පැහැදිලි කිරීමට යම් කලකදී උපයෝගී කරගනු ලබන මතවාදයක්, ඊට පසුව කෙරෙන නව පැහැදිලි කිරීමක් තුළින් ප්‍රතික්ෂේප වී යන බැවිනි. මෙලෙස ඇතිවන නව මතවාදයන්, විද්‍යාත්මක දියුණුවේ ආධාරයෙන් තවදුරටත් ව්‍යාජ ඒවා බවට

තහවුරු වෙමින් බිඳ වැටේ. මා මෙහි සඳහන් කිරීමට අදහස් කරනුයේ එබඳු ව්‍යාජ මතවාද පිළිබඳව නොව, තවදුරටත් සාකච්ඡාවට බඳුන් නොවන, එනම් ස්ථිරව තහවුරු වූ විද්‍යාත්මක දැනුම සහ කුර්ආණයේ එන වගන්තීන් සම්බන්ධවයි. කෙසේ වෙතත් මෙහිදී තවමත් සියයට සීයක්ම (100%) ස්ථාපිත නොවූ 'විද්‍යාත්මක කරුණු' කිහිපයක්ද ඉදිරිපත් කරන අතර, ඒවා හැකි පමණ පැහැදිලි කර පෙන්වා දීමට මම උත්සාහ කරමි.

කුර්ආනයේ එන සමහර දුර්ලභ උදහරණයන්, තවමත් නූතන විද්‍යාව තුළින් සනාථ කිරීමට මිනිසා අපොහොසත්ව ඇත. මෙවැනි කොටස්ද, ඉදිරි අනාගතයේ දී ඇතිවිය හැකි නව විද්‍යාත්මක දැනුම තුළින් තහවුරු කළහැකි බවට විශාල සම්භාවිතාවක් වන බව පෙන්වා දීමට මම උත්සාහ දරමි. උදහරණයක් ලෙස කුර්ආනයේ එන ජීවයේ ජලජ සම්භවය සම්බන්ධ වාක්‍යය පහත දැක්වේ.

"තවද, මම සෑම ජීව වස්තුවක්ම ජලයෙන් නිර්මාණය කළෙමි"

(ශු. කුර්ආනය: 21-30)

විද්‍යාත්මක කරුණු මෙලෙස සලකා බැලීමේදී, අප අමතක නොකළ යුතු වැදගත් කරුණක් නම්: කුර්ආණය යනු අතිවිශිෂ්ඨ ආගමික ග්‍රන්ථයක් වන අතර එය තනිකරම විද්‍යාත්මක අරමුණු වලින්ම පමණක් හෙබි විද්‍යා අත්පොතක් නොවන බවයි. අල්ලාහ්ගේ විශ්මිත මැවුම් හා නොයෙකුත් ස්වභාවික සිද්ධාන්ත කුර්ආනයේ ගෙනහැර දැක්වෙන ආකාරය පිළිබඳව විමසිල්ලෙන් බැලූ විට අපට පෙනී යනුයේ, එය රචනා කිරීමෙහි ප්‍රධානතම අරමුණ වනුයේ සර්වබලධාරී දේවත්වය තහවුරු කරලීම බවයි. විද්‍යාත්මකව ගොඩනැගුණකැ'යි ඇතැමුන් සළකණු ලබන නාස්තික වාද හෙවත් අදේව වාදය (දෙවියෙක් නොමැති යැයි සැලකීම) මගින් දේව

විශ්වාස වනසා දමා සමාජයේ පාලන බලය ලබාගැනීමට තැත් කරන යුගයෙක, කුර්ආණයේ වක්‍ර ආකාරයකින් හෝ හෙළිදරවු කෙරෙන ඉතා වටිනා විද්‍යාත්මක දැනුම් සම්භාරය, නියත වශයෙන්ම අප ලද මාහැඟි තිළිණයකි. කුර්ආනයෙහි ඇති ආශ්චර්‍යමත්භාවය සනාථ කිරීමට මීට අමතරව වෙනත් කිසිදු ලක්‍ෂණයක් හුවා දැක්වීම අනවශ්‍යය. කුර්ආනයේ එන විද්‍යාත්මක කරුණු, ඉස්ලාමීය හෙළිදරව් කිරීමට පමණක් විශේෂිත වන අතර, බයිබලයේ මෙවැනි ගුණාංග දක්නට නොලැබේ.

මවිසින් කරන ලද පර්යේෂණයේදී සම්පූර්ණයෙන්ම, විෂය මූලිකව රැඳී සිටීමට හැමවිටම මම උත්සාහ කළෙමි. කුර්ආනය පිළිබඳව විෂය මූලිකව කරුණු හැදෑරීමෙහිලා සාර්ථකත්වයක් අප ලැබූ බව මම විශ්වාස කරමි. මෙම විෂය මූලික භාවය වෛද්‍යවරයෙකු පළමු වරට රෝගියකුගේ වාර්තාවක් කියවීමට සමකළ හැකිය. වෙනත් අයුරකින් පැවසුවහොත්, නිවැරදි රෝග විනිශ්චයකට එළැඹිය හැක්කේ ඉතා ප්‍රවේශමෙන් රෝග ලක්‍ෂණ සියල්ල විශ්ලේෂණය කිරීමෙන් පමණි. තවද මෙම අධ්‍යයනය සඳහා මා පළමුව යොමුකරවූයේ ඉස්ලාමය පිළිබඳව ඇති විශ්වාසය නොව, සත්‍ය සොයාගැනීම පිළිබඳව මා තුළ වූ හුදු ආශාව බව අවධාරණය කිරීමට මම කැමැත්තෙමි. අද මා එය දකින්නේ මෙසේය. මාගේ අධ්‍යයන කටයුතු හමාර වනවිට මා රැස්කර ගන්නා ලද කරුණු පදනම් කරගෙන කුර්ආනය යනු සත්‍යවශයෙන්ම දෙවියන් විසින් මෙලොවට පහළ කරවන ලද ග්‍රන්ථයක් බවට කිසිදු සැකයකින් තොරව මම පිළිගනිමි.

# කුර්ආනයේ ඇති චලංගුභාවය

කුර්ආනය හා විද්‍යාව යන ප්‍රධාන මාතෘකාව වැඩි දුර විග්‍රහ කිරීමට මත්තෙන් අප විසින් සලකා බැලිය යුතු ඉතා වැදගත් කරුණක් වේ. එනම් කුර්ආනයෙහි ඇති චලංගුභාවය කෙබඳුද යන්නයි.

කුර්ආණය මෙලොව පහළ වූ මුල් අවධියේදී මුහම්මද් නබිතුමන් (සල්ලල්ලාහු අලෙයිවසල්ලම්)සහ ඔහුගේ සගයින් හා ඔහු වටා ඒකරාශීව සිටි විශ්වාසවන්තයින් විසින් එය කටපාඩම් කර මතකයේ රඳවාගත් අතරම, මුහම්මද් නබි තුමන්ගේ (සල්) අනුගාමිකයින් අතුරින් තෝරා පත්කරගන්නා ලද රචකයින් පිරිසක් විසින් ඒවා මැටි පුවරු මත හා ගල්වල ලියා තබන ලදී. මෙම කර්තව්‍යය සම්පූර්ණ කිරීම සඳහා දළ වශයෙන් වසර 23 ක කාලයක් ගත වූ අතර ඊට සමකාලීනවම තිල නොවන පිටපත් ගණනාවක්ම ලියා තබන ලදි. කුර්ආනයේ ප්‍රථම තිල පිටපත නිකුත් කිරීම මුහම්මද් නබිතුමාගේ මරණින් වසරකට පසු කලීෆා අබු බකර් නම් පාලකයාගේ උපදෙස් මත සිදුවිය. මෙහිදී අප දතයුතු තවත් ඉතා වැදගත් කරුණක් නම් මෙම තිල කුර්ආනයේ නිරවද්‍යතාවය, කඩපාඩමින් එකළ මිනිසුන් දැනසිටි කුර්ආනය සහ ලියා තබන ලද තිල නොවන පිටපත් ඇසුරින් හරස් පරීක්ෂණයට භාජනය කිරීමෙන් තහවුරු කරන ලද බවයි. සෑම මිනිසෙකුටම කියවීමේ හා ලිවීමේ හැකියාව නොතිබුණු යුගයක, කටපාඩමින් මතකයේ රඳවාගත් දැනුම අතිශයින්ම වැදගත් තැනක් ගති. එයට හේතුව සියළු දෙනාටම කටපාඩම් කර කරුණු මතකයේ තබාගත හැකි වීමයි. එසේ වුවද, කුර්ආනය ලේඛණගතකර තැබීමේ අවශ්‍යතාවය එහිම එන 'අල්-අලක්' නම් පරිච්ඡේදයේ පළමු පද්‍ය 4න් පැහැදිලි වේ. මෙය මුහම්මද් නබි තුමාට (සල්) පහළ වූ මුල්ම දේව වදන් වේ.

"කියවන්න! ඔබේ මැවුම්කරු වූ ඔබේ අධිපතිගේ නාමයෙන් ඔබේ අධිපති ඉතා උදරය,

ඔබට පැනෙන් ඉගැන්වූයේ ඔහුයි

ඔබ නොදත් දේ ඔබට ඉගැන්වූයේ ඔහුයි"

(ශු: කුර්ආනය: 96:1-5)

**කියවන්න !**

**මෙහිදී පැන යනුවෙන් අදහස් වන්නේ මානව විඥාණයයි.**

මින්පසුව පාලන තන්ත්‍රයට පිවිසි උස්මාන් නම් වූ කලීෆා වර්ෂ 13කට (මොහු මුහම්මද් නබිතුමාගේ (සල්) මරණින් පසුව 24 වසරක් කාලය තුළ රාජ්‍ය පාලනය කළේය.) ඔහුගේ පාලන සමයේ ප්‍රථම වසර 2 තුළ නිල කුර්ආනයේ පිටපත් 7ක් පුනර්නිෂ්පාදනය කර එවකට ලෝකයේ මුස්ලිම් පාලන බලය පැවති විශාල ප්‍රදේශයක් තුළ පතුරුවා හරින ලදී. එසේම සියළුම නිල නොවන පිටපත් විනාශ කර දැමූ අතර, මින් පසු කෙරුණු සෑම ප්‍රති නිර්මාණයක්ම සිදුවූයේ මෙම මුල් ග්‍රන්ථ පිටපත් හතෙන් පමණි.

මා ලියූ 'බයිබලය, කුර්ආනය හා විද්‍යාව යන ග්‍රන්ථයෙහි, මුහම්මද් තුමාගේ හිජ්රාගමණය (ක්‍රි. ව. 622 දී මක්කාවේ සිට මදීනාවට සංක්‍රමණය වීම) ට පෙර පහළ වූ කුර්ආනීය වැකි උපුටා දැක්වීම තුලින් සනාථ වන්නේ කුර්ආනය ලේඛණගත වීම මුහම්මද් තුමා මක්කාවෙන් නික්ම යෑමට පෙර සිටම සිදුවූ බවයි.

මෙලෙස කුර්ආනය පහළ වූ කාලය තුළම නිල පිටපත් ප්‍රකාශ කිරීමට සිදුවූ බව සනාථ කිරීමට බොහෝ ඓතිහාසික සාක්ෂි වේ. මහාචාර්ය ජාකොබ් බර්ක්ට අනුව, කුර්ආනය හා බයිබලය සැසඳීමේදී, යුදෙව් -ක්‍රිස්තියානි ග්‍රන්ථ පහලවීමටත්, රචනා කිරීමටත් අතර වූ ඉතා දිගු කාල පරතරය සසඳන විට කුර්ආනය වලංගුතාවයෙන් අතිශයින්ම ඉහලමට්ටමක වූවකි. එසේම තවත් අප

විසින් අමතක නොකළ යුතු කරුණක් වනුයේ කුර්ආනය පහළ වූ අවධියේම සිදුකළ එහි ප්‍රථම තිල ලිඛිත ග්‍රන්ථයෙහි අත් පිටපත් ගණනාවක්ම අදද අප අතර නිරුපද්‍රිතව පවතින බවයි.

තවත් වැදගත් කරුණක් මෙහිලා සඳහන් කිරීමට මම කැමැත්තෙමි. කුර්ආනයේ එන කරුණු මැනවින් අධ්‍යයනය කිරීමේදී, නූතන විද්‍යාත්මක දැනුමට එය අනුකූල වන බව අද අපට පැහැදිලි වුවද, අතීතයේ වූ මිනිසුන් මේ පිළිබඳව ගැඹුරින් වටහා ගැනීමට අපොහොසත් වූ අතර, කුර්ආනීය වැකි සම්පූර්ණයෙන්ම තේරුම් ගැනීමට අද පවා මිනිසා අපොහොසත්ය. මිනිසුන් විසින් මෙම ග්‍රන්ථය නිර්මාණය කරන ලද්දේ නම් හෝ මිනිසුන් විසින් එහි යම් කිසි වෙනසක් ඇතිකරන ලද්දේ නම් හෝ අද පවා තේරුම් ගත නොහැකිව කුර්ආනය පුරා විසිරී ඇති වගන්ති, මිනිස් වංචාවකට ලක් නොවී එලෙසින්ම, ආරම්භක ස්වරූපයෙන් අල්පමාත්‍ර වූ වෙනසකින් තොරව පැවතීම කිසිසේත් සිදුවිය නොහැක්කකි. එසේම කුර්ආනයේ එන කිසිදු කොටසකට යමෙකු විසින් ඉතා සුළු හෝ වෙනසක් ඇති කරන ලද්දේ නම් එහි ඇති ලාක්ෂණික ඒකාබද්ධතාවය කැපී පෙනෙන අන්දමින් බිඳ වැටී විනාශ වනු ඇත. එබැවින් එබඳු යම් වෙනසක් සිදුවී තිබුණි නම් එමගින් නූතන දැනුම හා කුර්ආනයෙහි එන කරුණු එකඟත්වයෙන් සනාථ වීම නිසැක වශයෙන්ම වැළැකෙනු ඇත. මක්නිසාද යත් එය එතරම් හොඳින් කැපී පෙනෙන බැවිනි. එමනිසා කුර්ආනයේ එන අදටත් තේරුම් ගත නොහැකි වූද, කිසිම වෙනසකට බඳුන් නොවූ වදන් එහි වලංගුතාවය විදහා පෙන්වන මනා සළකුණු බව ඕනෑම සාධාරණ අපක්ෂපාතී නිරීක්ෂකයෙකුට වැටහෙනු ඇත.

කුර්ආනය මිනිසා වෙත පහළ වීම පුරා වසර 23 ක කාලයක් මුළුල්ලෙහි සිදුවිණි. මෙය 'හිජ්රා' හි දෙපස පිහිටි එක හා සමාන.

කාල පරිච්ඡේද 2කින් සමන්විතය. (නබිතුමන්ගේ මක්කා සිට මදීනාව බලා සංක්‍රමණය වීම හිජ්රා නම් වේ.) මේ අනුව බැලීමේදී පොතෙහි එන විද්‍යාත්මක කරුණු විසිරී පැවතීම ස්වභාවිකය. අප විසින් සිදුකළ අධ්‍යයනයේදී, එක් එක් විෂයයට අදලව විවිධ පරිච්ඡේද වල විසිරී පැවතුණු අදහස් වෙන් වෙන් වශයෙන් නැවත ගොණු කිරීමට අපට සිදුවිය.

ඒවා කෙසේ වර්ගීකරණය කළ යුතුද යන්න මා හට මීළඟට ඇතිවූ පැණයයි. එනමුදු කුර්ආනයේ එබඳු වර්ගීකරණයක් පිළිබඳව කිසිඳු සඳහනක් හෝ යෝජනාවක් සොයාගත නොහැකි වූ බැවින්, ඒවා මාගේ සිතැහි පරිදි ඉදිරිපත් කිරීමට මම තීරණය කළෙමි.

මා සිතන පරිදි පළමුව සලකා බැලිය යුතු කරුණ වන්නේ 'මැවීමයි' මෙහිදී කුර්ආනයේ එන වගන්ති අද ලොව ව්‍යාප්තව පවතින විශ්වයේ සම්භවය සම්බන්ධ අදහස් හා සංසන්දනය කිරීම සුදුසු වේ. මීළඟට මෙම මාතෘකාව පහත සඳහන් අනුමාතෘකා යටතේ බෙද දක්වන ලදි. තාරකා විද්‍යාව, පෘථිවිය, සත්ත්ව සහ ශාක රාජධානි, මිනිසා සහ මිනිස් ප්‍රජනන ක්‍රියාවලිය ......... තවදුරටත් කුර්ආනයේ සහ බයිබලයේ එන වගන්තීන් අනුව ඉහත සඳහන් මාතෘකා වලට අදල සංසන්දනයක් සහ ඒවා නූතන දනුම තුළින් පැහැදිලි කිරීම ප්‍රයෝජනවත් වෙතැයි මම සිතමි. මෙය සිදුකරන ලද්දේ බයිබලයේ එන 'ජල ගැල්ම', 'නික්ම යාම', හා 'මැවීම' යන කොටස් ඇසුරිනි. එයට හේතුව මෙම මාතෘකා අද පවතින දැනුම ඇසුරින් අර්ථකථනය කිරීමට හැකි ඒවා වීමයි.

# විශ්වයේ මැවීම

විශ්වයේ මැවීම ගැන කුර්ආනයේ එන සංකල්ප පරීක්ෂා කිරීමේදී කැපී පෙනෙන වඩාත්ම වැදගත් කරුණ වනුයේ, කුර්ආනීය විස්තර විග්‍රහයන්, බයිබලයේ එන කරුණු වලින් බොහෝ සේ වෙනස් වීමයි. මෙම අදහස් බයිබලයේ සහ කුර්ආනයේ සමානත්වයක් පෙන්වීමට උත්සාහ දරන, බටහිර සම්පාදකවරුන්ගේ අදහස් වලට පරස්පර විරෝධීතාවයක් දක්වයි. සුළු වශයෙන් ඇති සමානකම් විශාල වශයෙන් හුවා දක්වමින්, කැපීපෙනෙන ආකාරයේ විශාල වෙනස්කම් නිහඬව නොසලකා හැරීම යථාර්ථය විරූප කර දැක්වීමකි. සමහර විට ඒ සඳහා ඔවුනට යම් හේතු සාධක තිබිය හැක.

මැවීම ගැන සඳහන් කිරීමේදී බටහිර ප්‍රදේශ වල පවත්නා ප්‍රබල අදහසක් වන "මැවීම සම්බන්ධව කුර්ආණයේ සඳහන් වන කරුණු මුහම්මද් නබිතුමන් (සල්) විසින් බයිබලයෙන් උපුටා ගත් ඒවාද" යන්න සලකා බැලිය යුතුය. මෙහිදී "දින 6ක මැවුම් කාලයක් සහ දෙවියන් විවේකගත් එක් දිනක කාලයක් (සැබැත්) වශයෙන් සම්පූර්ණ දින 7ක් මැවීමෙහි යෙදුණු බවට" බයිබලයේ එන කොටස් කුර්ආණයෙහි එන "අල්-අ:රාෆ්" පරිච්ඡේදය සමඟ සංසන්දනය කළ හැක.

"ආකාශය සහ පොළව දින 6ක් තුළ නිර්මාණය කරන ලද ඔබේ අධිපති දෙවියන්"

(ශු: කුර්ආනය: 7-54)

කෙසේ වුවද නූතන ව්‍යාඛ්‍යානයන්ට අනුව (ayyaam) යන අරාබි වදනෙහි තේරුම "අයියාම්" "දවස" ලෙස සාමාන්‍යයෙන් යොදා ගත්තද, එහි නියම අර්ථය වනුයේ "දිගු කාල පරිච්ඡේදයක්" යන්නයි. (එබැවින් එයින් පැය 24 කින් සමන්විත වූ දවසක් ගැන අදහස් නොකෙරේ.)

මෙහි දැක්වෙන තවත් මූලික වැදගත් කරුණක් වනුයේ, බයිබලයේ මෙන් නොව කුර්ආනයේ පොළව හා අහස මැවීම පිළිබඳව අනුපිළිවෙලක් සඳහන් නොවීමයි. කුර්ආනයේ එය එකකට පළමුව අනෙක වශයෙන් නොව පොදු මැවුමක් ලෙස සඳහන් වේ. මේ බව "තාහා" පරිච්ඡේදයේ දැක්වේ.

**"පොළව සහ ඊට ඉහලින් අහස මැව්වේ දෙවියන්ය"**
**(ශු: කුර්ආනය: 20 - 4)**

කුර්ආනයේ එන කරුණු වලින් හැඟෙන පරිදි ආකාශමය සහ භෞමික පරිණාමයන් එකිනෙකට සමාන්තර වේ. තවද මූලික වායුමය ස්කන්ධයක් (dukhaan) මැවීමේදී පැවැති බව සඳහන් කිරීම කුර්ආනයට පමණක් සීමිත වූ සඳහන් කිරීමකි. එසේම එකට එක්වී බැඳී පැවති මූලද්‍රව්‍ය ගොණුවක් (ratq) ක්‍රමක්‍රමයෙන් එකිනෙකින් වෙන්වී යාම (fatq) පිළිබඳව ද කුර්ආනය විස්තර කරයි. මේවා "ෆුස්සිලාත්" සහ "අල්-අන්බියා" යන පරිච්ඡේද වල සඳහන් වේ.

**"දෙවියන්වහන්සේ මතු වී අහස දෙසට හැරෙන විට එය වායු ස්කන්ධයක්** ............."

**(ශු: කුර්ආනය: 41-11)**

**"විශ්වාස නොකරන්නන් හට නොපෙනෙන්ද?**

**"අහස සහ පොළට එකට එක්ව පැවති අතර මම එය වෙන්කර හැරියෙමි"**

(ශු: කුර්ආනය: 21-30)

නූතන විද්‍යාවට අනුකූලව මෙම එකිනෙකින් වෙන්වීමේ ක්‍රියාවේ ප්‍රතිඵලය ලෙස බොහෝ ලෝක ඇතිවුණි. මෙම සංකල්පයම කුර්ආනයේ බොහෝ ස්ථානවල දැක්වේ. උදහරණයක් ලෙස ප්‍රථම පරිච්ඡේදය වූ "අල්-ෆාතිහා" හි පළමු වගන්තිය ගත හැක.

**"සියළු පැසසුම් සියලු ලෝක වලට අධිපති වූ දෙවියන්ටම වේවා"**
**(ශු: කුර්ආනය: 1-1 )**

මේ අනුව කුර්ආනීය සංකල්ප, නූතන අදහස් වන ප්‍රාථමික වලාකුලක මන්දකිණි, ධූලි) පැවැතීම හා එහි සංඝටක වෙන්ව යාමෙන් මන්දකිණීද ඉන්පසුව ඒ තුලින් තාරකාද, එයින් පසු ග්‍රහලෝකද බිහිවුණිය, යන්න සමඟ මනා එකඟත්වයක් පිළිබිඹු කරයි. දැනට

මේ සම්බන්ධව පවතින මහා පිපිරුම් වාදයට (Big bang Theory) අනුව ඝණීභවනය වූ ද්‍රව්‍යයන් තුළින්, ක්‍රමයෙන් පුළුල් වෙමින් විශාල ලෙස විහිදී යන 'ප්‍රාග් මන්දකිණී' නම්වූ කුඩා වලාවන් සෑදී පසුව එකිනෙකින් වෙන්වී, ඒ එක එකක් ස්වකීය ගුරුත්ව ක්ෂේත්‍රයේ බලයෙන් එකමත එක වැටී ඉන්පසු ඇතිවන සමෝධානිත ගුරුත්ව ක්ෂේත්‍රය හේතු කරගෙන වෙනත් මන්දකිණී බවට පරිවර්තනය වේ. මෙය නව බ්‍රිතාන්‍ය විශ්ව කෝෂයේ දහනවවැනි වෙළුමෙහි 636 වැනි පිටෙහි සඳහන් වේ.

කුර්ආනයේ 'අල්-ෆුර්ඛාන්' පරිච්ඡේදයෙහි පොළව හා අහසට අතරමැදි මැවුම් ගැනද සඳහන් වේ.

**"දෙවියන් වහන්සේ අහස, පොළව හා ඒ අවට ඇති සියළු දෑ මැවූ අතර** ........"

**(ශු: කුර්ආනය: 25-59)**

මෙම අතරමැදි මැවුම් නූතන සොයාගැනීම් වලට අනුකූලව, 'පදර්ථමය පාලම්' නොහොත් පිටතින් සංවිධානය වූ තාරකා විද්‍යාත්මක පද්ධතීන් වේ.

මෙම කෙටි සමාලෝචනයෙන් පැහැදිලි වනුයේ කුර්ආනයේ දැක්වෙන කරුණු හා නූතන විද්‍යාත්මක දත්ත අතර ඇති මනා එකඟතාවයයි. එසේම බයිබලයේ අංශ ගණනාවකින්ම පෙන්වා දෙන 'මැවුම' පිළිබඳ කරුණු නූතන විද්‍යාව හා එකඟ නොවන එමෙන්ම පිළිගත නොහැකි දෑ වේ. උදාහරණයක් ලෙස බයිබලයේ එන 'උත්පත්තිය' පොතෙහි 1 : 9-19 දක්වා වූ කරුණු සලකා බැලුවහොත් එහි පෘථිවිය තුන්වන දිනයෙහි නිර්මාණය කළ බවත්, අහස හතරවැනි දිනයේදී නිර්මාණය කළ බවත් සඳහන් වේ. නමුත් පෘථිවිය ඇතිවූයේ අහස, තරු හා ඉරඇතිවීමෙන් පසුව බව නිසැකවම අප අද දන්නා බැවින් බයිබලයේ අදහස් ප්‍රතික්ෂේප කිරීමට අපට සිදුවේ. එබැවින් මෙබඳු වාතාවරණයක් යටතේදී හැගෙනුයේ 'මුහම්මද් නබිතුමන් (සල්) බයිබලයෙන් කරුණු උපුටා ගැනීම කෙසේ වෙතත්, එහි ඇති වැරදි සංකල්ප නිවැරදි කිරීමක නම් යෙදුණු බවයි. (විශ්වයේ සම්භවය ගැන සලකා බැලීමේදී) එනමුදු විද්‍යාඥයිනට මෙම දැනුම ලබාගත හැකිවූයේ නබිතුමන්ගේ මරණින් ශතවර්ෂ ගණනාවකටම පසුවය.

# තාරකා විද්‍යාව

කුර්ආනයේ තාරකා විද්‍යාව සම්බන්ධ වැදගත් විස්තර සඳහන් වන බව මවිසින් බටහිර ජාතිකයින්ට පැවසූ බොහෝ අවස්ථාවලදී, ඔවුන් එයට පිළිතුරු වශයෙන් පැවසුයේ එය පුදුමයට කරුණක් නොවන බවයි. මක්නිසාද යත් යුරෝපීය ජාතිකයිනට වඩා අරාබි ජාතිකයින් තාරකා විද්‍යා ක්ෂේත්‍රයෙහි ඉදිරියෙන් සිටි අතර ඔවුහු බොහෝ වැදගත් සොයා ගැනීම් වලටද වගකියති. නමුත් මෙය ඉතිහාසය පිළිබඳ නොදැනීම හේතුවෙන් සාවද්‍ය ලෙස තේරුම් ගනු ලැබූ අදහසකි. පළමුව අරාබි ලෝකය තුළ විද්‍යාත්මක දියුණුවක් ඇතිවූයේ කුර්ආනයේ පහලවීමෙන් සැලකිය යුතු තරම් කාලයකට පසුවය. දෙවනුව - කුර්ආනය පහල වූ වකවානුව තුළ ඉස්ලාමීය ජන සමාජය තුළ පැවති විද්‍යා දැනුම ගැන සලකා බලන විට කිසිම මිනිසෙකු ආකාශ වස්තූන් සම්බන්ධව කුරානය හා සැසඳිය හැකි ප්‍රමාණයක හෝ ප්‍රකාශණයක් කිරීමට අපොහොසත් අය වූහ.

තාරකා විද්‍යාව යනු ඉතා පුළුල්ව සලකා බැලිය යුතු විෂය ක්ෂේත්‍රයක් වුවද මම මෙහිදී එය ඉතා කෙටියෙන් ඉදිරිපත් කරන්නෙමි.

## ඉර හා සඳ

බයිබලයෙහි සූර්‍ය්‍යයාගේ සහ චන්ද්‍රයාගේ ආලෝකයන් අතර ඇති එකම වෙනස ලෙස ඒවායේ ඇති ආලෝක ප්‍රමාණයන්ගේ අඩුවැඩි බව සඳහන් කරයි. නමුත් කුර්ආනයෙහි මේ දෙආකාරයක ආලෝකයන් ලෙස පැහැදිලිව වෙන්කර දක්වයි. සූර්යයාගේ ආලෝකය 'ලාම්පුවක්' සිරාජ් (siraaj) ලෙසද, චන්ද්‍රයාගේ ආලෝකය 'එළිය' නූර් (noor) ලෙසද එහි සඳහන් වේ.

**"අල්ලාහ් විසින් ආකාශ 7 ක් එකකට ඉහලින් අනික සිටින සේ මවා ඒවාට ඉර (ලාම්පුව) සහ හඳ (එළිය) ලබා දුන් බව නොදුටුවෙහිද?"**

**(ශු: කුර්ආනය: 78:12-13)**

චන්ද්‍රයා පරාවර්තිත ආලෝකය පමණක් ඇති බෙලහීන වස්තුවක් වන අතර, සූර්‍ය්‍යයා ස්ථිර, දහන ක්‍රියාවලියක් මගින් ආලෝකය හා තාපය උපදවන ප්‍රධාන ආකාශ වස්තුවකි.

## තාරකා සහ ග්‍රහලෝක

කුර්ආනයේ 86 වැනි පරිච්ඡේදයෙහි 3 වන වගන්තියෙහි සඳහන් වන පරිදි තාරකා නජ්ම් (najm) යන වචනය තාඕබ් (thaaqib) නම් විශේෂණ පදය හා එක්ව යෙදේ. 'Thaaqib' යන්නෙන් අදහස් වනුයේ, රාත්‍රියේ අඳුරු සෙවනැලි තුලින් විනිවිද මතුව පෙනෙන, තමා විසින් තමා තුළම දහනයක් ඇති කර ගනිමින් එහි ප්‍රතිඵලයක් ලෙස ආලෝකය විහිදුවන වස්තූන් යන්නයි. දැනට සොයාගෙන ඇති කරුණු අනුව තාරකා යනු තමන් තුළම ස්වකීය ආලෝකය නිපදවා ගනු ලබන අපගේ සූර්‍ය්‍යයා බඳුම වූ ආකාශ වස්තූන්ය. (එනම් සූර්‍ය්‍යයාද තාරකාවකි.)

කුර්ආනයේ ග්‍රහලෝක හැඳින්වීම සඳහා 'කව්කාබ්' (Kawkab) නම් වූ විශේෂ පදය යොදා ගනී. එයින් අදහස් වනුයේ ඒවාද ආකාශ වස්තූන් වන අතර, සූර්යයා මෙන් තමාගේ ආලෝකය තමාටම නිපදවා ගත නොහැකි ආලෝකය පරාවර්තනය කිරීමෙහි පමණක් යෙදෙන වස්තූන් බවයි.

**"පහල ආකාශය අලංකාර ආභරණ වූ ග්‍රහලෝක වලින් අපි සරසා ඇත්තෙමු."**

**(ශු: කුර්ආනය: 37-6)**

## කක්ෂය

ආකාශ වස්තු පද්ධතීන් පිළිබඳව බලපැවැත්වෙන නීති රීතීන් තාරකා භෞතික විද්‍යාව විෂය තුළින් අද අපි ඉතා හොඳින් දැන සිටිමු. ඒ අනුව මන්දාකිණියක සමතුලිතතාවය රඳා පවතිනුයේ එහි ඇති ග්‍රහලෝක හා තාරකා ස්වකීය කක්ෂවල පිහිටන ස්ථානයන්

මත සහ මේ එක් එක් වස්තූන්ගේ ස්කන්ධයන් මගින් ඇති කෙරෙන ගුරුත්වාකර්ෂණ බලය හා ඒවායේ චලන වේගයන් අතර ඇති අන්‍යොන්‍ය සම්බන්ධතාවය මතය.

නූතන යුගයේදී පමණක් ගෙනහැර දැක්විය හැකි මෙම සත්‍යයන් කුර්ආණයේ "අල්-අම්බියා" නම් පරිච්ඡේදයෙහි මෙසේ සඳහන් වේ.

**"රාත්‍රිය සහ දවාලත්, සූර්යයා හා චන්ද්‍රයාත් මවන ලද්දේ දෙවියන් වහන්සේ විසිනි. සූර්යයා හා චන්ද්‍රයා එකිනෙකින් වෙනස් වූ කක්ෂවල ඒවාට ආවේණික වූ චලන වේගයන්ගෙන් යුතුව ගමන් කරති"**

**(ශු: කුර්ආනය: 21-33)**

'Yasbahoon' යන අරාබි වදනින් අදහස් වනුයේ ගමන් කරන වස්තුවක් මගින් ඇතිවන චලනය යන්නයි. එය ධාවකයෙකුගේ පොළව මත පිහිටි පාදවල චලනය හෝ, ජලයෙහි පැද්දීමේ ක්‍රියාව සඳහා ද යෙදෙන අතර, එය ආකාෂ වස්තුවක් සඳහා යොදන විට "තමන්ට ආවේණික චලනයක් සහිතව ගමන් කරන" යන අර්ථය ගෙනදේ.

'බයිබලය, කුර්ආනය සහ විද්‍යාව' නම් වූ මාගේ පොතෙහි මේ පිළිබඳව නිවැරදි සවිස්තරාත්මක විග්‍රහයන් (ආකාශ වස්තුවල චලනය පිළිබඳව) ඉදිරිපත් කර ඇත. චන්ද්‍රයා සම්බන්ධයෙන් මෙම කරුණු දැනට ඉතා හොඳින් තහවුරු වී ඇති අතර, සූර්යයා සම්බන්ධව තවමත් එය එතරම් පුළුල් ලෙස භාවිතා නොකෙරේ.

## දහවල සහ රාත්‍රිය

කුර්ආනීය විස්තරවලට අනුව කෙරෙන දහවල හා රාත්‍රිය සම්බන්ධ පැහැදිලි කිරීම් එදට වඩා අදට යෝග්‍ය වන අන්දමින් සැකසී ඇත. 'Kawwara' යන වදන මගින් කුර්ආනයේ "අස් ZZුමර්" පරිච්ඡේදයෙහි, රාත්‍රිය දහවල සමඟත් දහවල රාත්‍රිය සමඟත් වෙළී හෝ ඇඹරී පවතින ආකාරය විස්තර කෙරේ.

**"ඔහු දහවල රාත්‍රිය මතත් රාත්‍රිය දහවල මතත් වෙලා ඇත"**

**(ශු: කුර්ආනය: 39-5)**

Kawwara යන්නෙහි නියම අරුත නම් තලප්පාවක් (හිස් ආවරණයක්) හිසෙහි වෙලීම යන්නයි. කුර්ආනය පහළ වූ අවධියේදී මෙම සැසඳීම් කිරීමට අත්‍යවශ්‍ය වූ තාරකා විද්‍යාත්මක දත්ත මිනිසුන් නොදැන සිටි බැවින් මෙය ඉතා පැහැදිලි හා වලංගු සංසන්දනය කිරීමකි. මිනිසා සඳමත පා තබා නිරීක්ෂණය කරන තුරුම පෘථිවිය තම අක්ෂය වටා කරකැවෙන බවත්, ලෝක ගෝලයෙහි අඳුරු අර්ධය සැමවිටම ආලෝකමත් අර්ධය හා වෙලී පැවතීමත්, ආලෝකමත් අර්ධය එලෙසම අඳුරු අර්ධය හා වෙලී පැවතීමත් අප වටහාගෙන නොතිබුණි.

## සෞර මුදුණ

සූර්‍ය්‍යයා සඳහා ස්ථාවර ස්ථානයක් පැවතීම පිළිබඳව හරවත් ලෙසින් "යාසීන්" නම් කුර්ආනීය පරිච්ඡේදයේ විග්‍රහ වේ.

**"සූර්‍ය්‍යයා තම ගමන්මඟ නියමිත ස්ථානයක් කරා යොමුකර ඇත. ඒ සර්වබලධාරී අල්ලාහ්ගේ ආඥාවයි. ඔහු සියල්ල දනියි."**

**(ශු: කුර්ආනය: 36-38)**

'මුස්තකර්' "Mustaqarr" යන අරාබි වදනින් "නියමිත ස්ථාවර ස්ථානය" යන තේරුම ගෙනදේ. එය 'හරියටම නම් කළ ස්ථානය" වශයෙන්ද දැක්විය හැක. නූතන තාරකා විද්‍යාවට අනුව සෞරග්‍රහ මණ්ඩලය තත්පරයට සැතපුම් 12 ක වේගයෙන් අභ්‍යාවකාශයේ පිහිටි හර්කියුලීස් නම් තාරකා පන්තිය (alpha lyrac) දෙසට ගමන් කරයි. මෙම 'හර්කියුලිස්' තරු රාශියේ පිහිටීම ස්ථිරව හා නිවැරදිව ගණනය කර ඇති අතර මෙම ස්ථානය 'සෞර මුදුණ' ලෙස තාරකා විද්‍යාඥයින් විසින් නම්කර ඇත.

## විශ්වයේ ප්‍රසාරණය වීම

"අත්-ද්‍රාරියාත්" නම් කුර්ආනීය පරිච්ඡේදය මගින් වක්‍ර ආකාරයෙන් පවසනුයේ නූතන විද්‍යාවේ අනගි සොයාගැනීමක් ලෙස දැක්වෙන 'විශ්වය ප්‍රසාරණය වීම' පිළිබඳවයි.

**'මම අසහාය බලයක් සහිතව අහස සැදුවෙමි. තවද එය ප්‍රසාරණය කරනු ලබන්නේ ද මා විසිනි'**

**(ශු: කුර්ආනය: 51-47)**

විශ්වයේ ප්‍රසාරණය පිළිබඳව පළමු අදහස් ඉදිරිපත් වූයේ සාපේක්ෂතා වාදය ඇසුරෙනි. පසුව මෙය තාරකා භෞතික විද්‍යාවේ එන ගණනය කිරීම් තුළින් තහවුරු කරන ලදී. මන්දාකිණි ආලෝකය වර්ණාවලියේ එන රතු පැහැ ප්‍රදේශය දෙසට දක්වන චලිතය, මන්දකිණි 2ක් එකිනෙකින් ඉවත්වන දුර ප්‍රමාණයෙන් පැහැදිලි වේ. එබැවින් විශ්වයේ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී.

## අභ්‍යවකාශය ජය ගැනීම

නූතන විද්‍යාව තුළින් අත්පත් කර ගන්නා ලද ජයග්‍රහණ අතරට 'අභ්‍යවකාශය ජය ගැනීමද' මෑතකදී එක්වී ඇත. මිනිසාගේ මුල්ම චන්ද්‍ර ගමන තුළින් මෙය සිදුවිය. කුර්ආනයෙහි එන 'අර්-රහ්මාන්' පරිච්ඡේදයේ මේ පිළිබඳව අනාවැකි ඉදිරිපත් කර ඇත.

**"ඒකරාශීවී සිටින ජින්වරුනි, මිනිසුනි, ඔබට හැකිනම් පෘථිවි තලයේත්, ආකාශයෙත් යම් යම් ප්‍රදේශ තරණය කරන්න. එහෙත් අල්ලාහ්ගේ අනුදැනුම හා අධිකාරිය රහිතව ඔබට මෙම ප්‍රදේශ තුළට එළැඹිය නොහැක."**

**(ශු: කුර්ආනය: 55-33)**

අභ්‍යවකාශයෙහි ගමන් කිරීමට බලය ලබාදිය හැක්කේ, අභ්‍යවකාශයේ චලන සම්බන්ධ නීති ක්‍රියාත්මක කරවන මැවුම්කරු හට පමණි. මෙම සම්පූර්ණ කුර්ආනීය පරිච්ඡේදයම මගින් අල්ලාහ්ගේ පරෝපකාරී ගුණය හඳුනාගැනීමට මිනිස් වර්ගයා හට පොදු, විවෘත ආරාධනයක් කරනු ලබයි.

# භූ ගර්භ විද්‍යාව

අප වාසය කරන ග්‍රහලෝකය වූ පෘථිවිය ගැන කුර්ආනයේ සඳහන්වන පුදුම උපදවන හෙළිදරව් කිරීම් පිළිබඳව දැන් අපි සලකා බලමු. එහි පෘථිවිය සම්බන්ධව එහි මතුපිටින් දර්ශණය වන භෞතික සිද්ධාන්ත ගැන පමණක් නොව, එහි වාසය කරන ජීවීන් පිළිබඳවද ඉතා හොඳින් විස්තර ඉදිරිපත් කර ඇත.

අප මෙතෙක් සාකච්ඡා කළ කරුණු මෙන්ම, කුර්ආනයෙහි භූගර්භ විද්‍යාව පිළිබඳවද මනා සංකල්පයන් ඉදිරිපත් කර ඇත. භූගර්භ විද්‍යාව කුර්ආනය පහළ වූ සමයට බොහෝ පසු කාලයකදී ඇතිවී, දියුණු වූ විද්‍යා ක්ෂේත්‍රයකි.

මේ අනුව අපට අපගෙන්ම පහත සඳහන් ප්‍රශ්න ඇසීමට සිදුවේ. කාන්තාරයක් මැද ජීවත් වූ නූගත් මිනිසෙක්, මිථ්‍යා විශ්වාසයන්ගේ ආධිපත්‍යයට ලෝකය යටත්ව සිටි සමයක සියළුම විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව ඇතිවූ ගැටළු නිවැරදිව නිරාකරණය කරගනිමින්, තමන් වෙත පහළ වූ දර්ශණය පැතිරවීමෙහි නිරත වූයේ කෙසේද? ඔහුගෙන් ශතවර්ෂ ගණනාවකට පසු යුගයකදී පමණක් සාවද්‍ය බවට පූර්ණ වශයෙන් ඔප්පුකර ඉවතලන ලද විශ්වාසයන් ඔහු ඊට බොහෝ කලකට පෙර ඉතා දක්ෂ ලෙස බැහැර කළේ කෙසේද?

## ජල චක්‍රය

පෘථිවියෙහි ක්‍රියාත්මක වන විවිධ පද්ධති පිළිබඳව කුර්ආනයේ එන වගන්තීන් මෙහිදී විමසා බලමු. 'බයිබලය කුර්ආනය සහ විද්‍යාව' නම් මාගේ ග්‍රන්ථයෙහි මෙවැනි බොහෝ දෑ පිළිබඳව විස්තර මවිසින් ඉදිරිපත් කර ඇති අතර, මෙහිදී ස්වභාවික 'ජලචක්‍රය' පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරනු කැමැත්තෙමි. මේ මාතෘකාව සම්බන්ධයෙන් අද අපට ඉතා හොඳ අවබෝධයක් ඇත.

මේ හේතුවෙන් ජලචක්‍රය පිළිබඳවවූ අදහස් සියල්ලම සම්පූර්ණයෙන්ම ප්‍රත්‍යක්‍ෂ ලෙස සනාථ වේ. කුර්ආනය පහළ වූ අවධියේ මේ පිළිබඳව වූ අදහස් සලකා බැලීමේදී පෙනී යනුයේ, ජල සම්පාදනය පිළිබඳ යම් දැනුමක් මෙකල මිනිසුන් සතු වුවද, ඒ සියල්ල නිරීක්‍ෂණ මත පදනම වූ ඒවා නොව, මිථ්‍යා මතවාද හා විචාරාත්මක දාර්ශණික අදහස් මත පදනම් වූ ඒවා බවයි.

'අස් zදුමර්' පරිච්ඡේදයේ එන පහත සඳහන් වගන්ති උදාහරණ වශයෙන් අපි දැන් සලකා බලමු.

**"අල්ලාහ් අහසින් වැසිදිය පහලට එවා. එම වැසි දිය පොළව තුළට විනිවිද යාමට සලස්වා ඒ තුළින් උල්පත් දිය බිහිකර. ඒ උපකාරයෙන් පොළව මත විවිධ වර්ණයන්ගෙන් යුතු වගාවන් ඇති කළ බව ඔබ නුදුටුවෙහිද?"**

**(ශු: කුර්ආනය: 39-21)**

අද දිනයේදී මෙය ඉතා සරල ලෙස අපට හැඟී ගියද, කුර්ආනය පහළ වූ, අදට බොහෝ ඈත යුගයකදී, එය එසේ නොවූ බව අප තරයේ සිතට ගත යුතුය. 16 වන ශත වර්ෂයේදී 'බර්නාඩ් පැලිසි' විසින් ජලචක්‍රය පිළිබඳව නියම සම්බන්ධතාවයන් සහිතව කරුණු අනාවරණය කරන තුරුම මෙය ලොවට රහසක්ව පැවතුණි. ඊට පෙර කාලයන්හිදී මිනිසුන් විශ්වාස කරන ලද්දේ සාගර ජලය සුළඟේ බලපෑම හේතුකොට ගෙන මහාද්වීප තුළට කිඳා බැස මහා අගාධයන් හරහා නැවත සමුද්‍රය කරා පැමිණෙන බවයි, ප්ලේටෝගේ සමයෙහි පටන් මේ මහා අගාධ tartarus නමින් හැඳින්විය.

(පාතාල ලෝකයේ ග්‍රීක දෙවිඳුන් ලෙස විශ්වාස කළ ප්ලූටෝ ඔහුගේ රැජින වූ පෙතසෆෝන් (persephone) සමඟ මරණය හා නිරයේ බලතල සහිතව ජීවත්වූ ප්‍රදේශය 'හදේස් නිවහන' ලෙස හඳුන්වනු ලැබූ අතර, එයට දුරස්ථව පිහිටි tartarus අගාධය අපායේ දඬුවම් දෙනු ලබන ස්ථානය ලෙසත් සැලකේ. පසු කලෙක මේ ස්ථාන 2

අතර ඇති පරතරය අඩුවී ගොස් 'හදේස් නිවහන' හා tartarus අගාධය එකක්යැයි සලකන ලදී.

(නව බ්‍රිතාන්‍ය විශ්ව කෝෂය - 15 වන වෙළුම - පිටු අංක 606)

17 වන ශතවර්ෂයේ විසූ මහා චින්තකයෙකු වන Descartes පවා මෙම මිථ්‍යා මතය විශ්වාස කළේය. 'ඇරිස්ටෝටල්' විසින් මේ සම්බන්ධව සඳහන් කළ මත 19 වන ශතවර්ෂයේදී පවා බොහෝ දෙනෙකු විසින් පිළිගනු ලැබුණි. ඇරිස්ටෝටල්ගේ මතයෙහි සීත කඳු මුදුන්වල පිහිටි ගැඹුරු බිංගෙවල් වැනි කුහර තුළ ජලය ඝණීභවනයවී සෑදෙන භූගත ස්කන්ධයෙන් උල්පත් පෝෂණය වන බව සඳහන් වේ. නමුත් වැසිදියෙන් පොළව තුළට කාන්දු වී යන ජලය මගින් උල්පත් පෝෂණය වන බව අද හොඳින් දන්නා කරුණකි. මේ අනුව සලකා බැලීමේදී කුර්ආනයෙහි මේ විෂයයට අදාලව දැක්වෙන කරුණු අද අප දන්නා නූතන 'ජල විද්‍යාවේ' (Hydrology) එන දත්තයන් හා මනාව ගැලපෙන බව පෙනී යයි.

## කඳු

නූතන භූගර්භ විද්‍යාවේ නව සොයාගැනීමක් වූ කඳු පද්ධති සැකසීම පිළිබඳ ස්ථරීය වාදය නොහොත් රැළිති සිද්ධාන්තය (Folding phenomenon) මෙසේ සඳහන් කරයි. "පෘථිවියෙහි පිටත කොටස හෙවත් 'කබොල' ඝණ කවචයකින් සෑදී ඇති අතර එහි ගැඹුරු ස්ථරයන් උණුසුම් දියරයකින් සමන්විතය. මේ නිසා එම කොටස ජීවීන්ගේ වාසයට නුසුදුසු වේ." තවද මෙම සිද්ධාන්තයෙන් කඳු පද්ධති ඇතිවීම හා එමගින් ඇතිවන ස්ථාවරත්වය ගැනද කියැවේ. පෘථිවිය මතුපිට ස්ථර හෙවත් 'කබොල' කොටස් එහි පහත් ස්ථර දෙසට නැඹුරු වී කඳු සැකසීමට අදල අත්තිවාරම ගොඩනගන අතර, ඒ මත ස්ථර වශයෙන් එක් රැස්වන පෘථිවි 'කබොල' කොටස් වලින් සමන්විත වී පසුව සෑදෙන කඳු වලට මෙමගින් ස්ථාවරත්වයක් සැපයේ.

දැන් මෙම කරුණු කුර්ආනයේ එන කරුණු හා සසඳා බලමු. එය එහි එන "අන්නාබා" නම් පරිච්ඡේදයේ මෙසේ දැක්වේ.

**අප පොළව තතා ඒ තුළින් විකාශණය වූ ප්‍රසාරණයත් මගින් කඳු මුදුන් නොතැනුවෙමුද?**

**(ශු: කුර්ආනය: 78-6 සහ 7)**

'Awtaad' යන අරාබි වදනින් ශිඛරය, මුදුන යන අර්ථයන් ගෙනදෙන අතරම මෙයින් කූඩාරමක් නැංගුරම් ලෑමේදී පොළව හා සම්බන්ධව පවතින ආකාරයද අදහස් කෙරේ. මෙයින් එහි භූස්ථර වලින් සමන්විත වූ ගැඹුරු අත්තිවාරම ගැනද පැහැදිලි කෙරේ.

මෙහිදීද මා මෙතෙක් ඉදිරිපත් කළ අන් මාතෘකා වලදී මෙන්ම නූතන විද්‍යාව හා කුර්ආනයේ එන කරුණු අතර පරස්පර විරෝධීතාවයක් හඳුනා ගැනීමට කිසිම අපක්ෂපාතී නිරීක්ෂකයෙකු සමත් වී නොමැත.

# ජීව විද්‍යාව

කුර්ආනයෙහි සඳහන්වන ශාක හා සත්ත්ව රාජධානි පිළිබඳ කරුණු (විශේෂයෙන්ම ප්‍රජනනය හා සම්බන්ධව) මගින් අන් සියළු දෙයකටම වඩා මා මවිතයට පත්වුණි.

ඇත්ත වශයෙන්ම මේ විෂයය සම්බන්ධයෙන් පුළුල් වශයෙන් හා වැඩි කාලයක් යොදා ගෙන සාකච්ඡා කළ යුතුව පැවතියද, මෙම ඉදිරිපත් කිරීමෙහි ඇති සීමිත ඉඩකඩ හේතුවෙන් මට මෙහිදී ඉදිරිපත් කළ හැක්කේ උදහරණ සුළු ප්‍රමාණයක් පමණි.

කුර්ආනීය පරිච්ඡේද වල සඳහන්වන සැඟවුණු අර්ථයන් වටහා ගැනීමට අද අප සමත්ව ඇත්තේ නූතන විද්‍යාවේ දියුණුව හේතුවෙන් බව මම නැවත වරක් අවධාරණය කරනු කැමැත්තෙමි. ඇතැම් කුර්ආනීය පරිවර්තනයන් සහ ඒ සම්බන්ධව එන විස්තර විවරණයන් රචනා කරන ලද උගතුන් සමහරෙක්, නූතන විද්‍යාදැනුමෙන් තොරවූවන් බැවින් - අද ඇතැම් විද්‍යාඥයින් සමහරෙක් මෙබඳු විවරණයන් පිළිගත නොහැකි ඒවා ලෙස සලකණු ලබයි.

කුර්ආනයේ එන ඇතැම් කරුණු නිසැකවම පහසුවෙන් තේරුම් ගත හැකි ඒවා වන නමුදු එහි සැඟවුණු විද්‍යාත්මක අර්ථයන් පුදුම උපදවන සුළු ඒවා වේ. උදහරණයක් ලෙස 'අල් අම්බියා' පරිච්ඡේදය සලකා බලමු.

**අහස හා පොළව එක්ව තිබුණු අතර, එය මා විසින් දෙකඩ කර හැර, සියළුම ජීවීන් ජලය තුළින් සෑදූ බව අවිශ්වාසවන්තයින් වටහා නොගතියිද?**

**ඔවුන් තවමත් විශ්වාස නොකරන්නෙහිද?**

**(ශු: කුර්ආනය: 21 - 30)**

මෙය නූතන විද්‍යාවේ එන ජීවයේ සම්භවය ජලජව සිදුවූවකැයි යන්න චමත්කාරජනක ලෙස සනාථ කර දක්වයි.

## උද්භිද විද්‍යාව

මුහම්මද් නබිතුමාගේ (සල්) සමයෙහි කිසිදු රටක විසූ කිසිදු විද්‍යාඥයෙකු සතු උද්භිද විද්‍යා දැනුම මගින් ශාකයන් ස්ත්‍රී සහ පුරුෂ වශයෙන් අංගයන් දෙකකින් සමන්විත වන බව පැවසීමට සමත් නොවීය. එහෙත් කුර්ආනයෙහි එන 'තාහා' පරිච්ඡේදයේ එය මෙසේ සඳහන් වේ.

**"දෙවියන්වහන්සේ විසින් අහසින් පොළවට වැසි වස්සවා, නොයෙක් වර්ගයේ ශාකයන් යුගල වශයෙන් ඇති වීමට සලස්වන ලදී."**

**(ශු: කුර්ආනය: 20-53)**

එල ඇති කරනු ලබන සියළුම ශාක ලිංගික ලක්ෂණ වලින් සමන්විත වන බව (ස්ත්‍රී හා පුරුෂ කොටස් අතර සිදුවන සංසේචනයෙන් එල හටගන්නා බව) අද අප හොඳින් දන්නා කරුණකි. එසේ වුවද, කෙසෙල් වැනි ශාක වලදී සංසේචනය නොවූ මල් තුලින්ද එල හටගනී. මලක් යනු ශාකයක ලිංගික අවයව රැඳී ඇති කොටස වේ.

කුර්ආනයේ 'අර්-රාද්' පරිච්ඡේදයේ මෙසේ සඳහන් වේ.

"........... **දෙවියන් විසින් මෙලොව මැවූ සියළු පළතුරු යුගල් වලින් ඇතිකරන ලදී."**

**(ශු: කුර්ආනය: 13-3)**

## කායික විද්‍යාව

මෙම ක්ෂේත්‍රයේදී කුර්ආනයෙහි එන අදහස් අතිශයින්ම වැදගත් යැයි මට හැඟේ. 'රුධිර සංසරණ පද්ධතිය' පිළිබඳව සොයාගැනීමට දළවශයෙන් වසර දහසකට පමණ පෙර කලකදී - ආහාර ජීර්ණයේ ඵල ලෙස අවශෝෂණය කරගන්නා ද්‍රව්‍ය මුළු සිරුර තුළම ගමන් කරමින් සෑම අභ්‍යන්තර ඉන්ද්‍රියයකටම පෝෂණය සලසා දෙන බවත්, කිරි වල සංයුතියෙහි ප්‍රභවය වන්නේද මෙම සංසරණ ද්‍රව්‍ය බවත් ....... වශයෙන් නූතන විද්‍යාව හා බෙහෙවින් සැසඳෙන කරුණු කුර්ආනීය පරිච්ඡේදයන්හි විස්තර වේ.

මෙම කුර්ආනීය කරුණු අවබෝධ කරගැනීමට පළමුව අප දත යුතු කරුණක් වේ. එනම් අපගේ මුඛය, ආමාශය හා අන්ත්‍රයන් (බඩවැල්) යන කොටස් තුළදී අප ගනු ලබන ආහාර හා එන්සයිම නම් රසායනික ද්‍රව්‍යයන් අතර සිදුවන ප්‍රතික්‍රියාවන්හි ප්‍රතිඵලයක් ලෙස නිකුත් කෙරෙන, අණුක ස්වරූපයෙන් පවතින පෝෂ්‍ය පදර්ථයන්, අන්ත්‍රයේ බිත්ති මතවූ 'අංගුලිකා' නම් වූ කුඩා ප්‍රසර තුළින් රුධිර සංසරණ පද්ධතියට අවශෝෂණය කරගනු ලබයි. මෙහි ඇති රුධිරය මඟින් මෙලෙස අවශෝෂණය කරගත් පෝෂ්‍ය පදර්ථයන් ශරීරයේ ඇති සියළුම ඉන්ද්‍රයයන් වෙත ප්‍රවාහණය කෙරේ. කිරි නිෂ්පාදනය කරනු ලබන 'ස්තන ග්‍රන්ථීන්ද' මේ ඉන්ද්‍රියයන් අතරට අයත් වේ.

ශත වර්ෂ ගණනාවකට ඉහත දී තේරුම් ගත නොහැකිව තිබූ මෙම ජීව විද්‍යාත්මක ක්‍රියාදාමය පිළිබඳව වූ අඩංගු කරුණු කුර්ආනයේ එන කොටස් කිහිපයක් අධ්‍යයනය කිරීමෙන් අපහට ඉතා පහසුවෙන් අවබෝධ කරගත හැක. මෙය "අන්නහල්" නම් පරිච්ඡේදයේ මෙසේ දැක්වෙයි.

"සැබැවින්ම ගවයන් තුළ ඔබට ඉගෙනීමට පාඩමක් වේ. මම ඔබට බීමට ලබාදුන්නේ ඔවුන්ගේ අන්ත්‍රවල අඩංගු දැයින් හා රුධිරයෙන් සංයුක්ත වී සෑදී ඇති කිරි නම් වූ දියරයයි. එය පානය කරන්නා පිරිසිදු හා ඉතා ප්‍රියමනාප වන්නේය."

ස්තන ග්‍රන්ථි වලින් ස්‍රාවය වන කිරිවල සංයුතිය සැබැවින්ම සමන්විත වනුයේ රුධිරය මගින් එම ග්‍රන්ථි වලට පරිවහණය කෙරෙන ආහාර ජීර්ණයේ අන්ත ඵලයන් ලෙස ඇතිවන පෝෂණ සංඝටක වලිනි. රුධිරය හා මෙම පෝෂණ සංඝටක අන්ත්‍ර බිත්ති මතදීම එකට සංයෝජනය වී පවතී.

මුහම්මද් නබි තුමාගේ (සල්) මරණින් වසර දහසකට පසු රසායනික විද්‍යාව හා කායික විද්‍යාව මගින් ඉතා නිවැරදිව පරීක්ෂාවට භාජනය කරන ලදුව තහවුරු වූ මෙම සත්‍යයන් කුර්ආනයේ ඉහත දැක්වෙන අයුරින් ඉදිරිපත් කර ඇත.

# කළල විද්‍යාව

කුර්ආනයේ සඳහන්වන මානව ප්‍රජනන ක්‍රියාවලිය සම්බන්ධව බොහෝ කරුණු, මෙම විෂයය පැහැදිලි කිරීමට මානව නිදර්ශණයන් පතන නූතන කළල විද්‍යා විශේෂඥයනට විශාල අභියෝගයක් එල්ල කර ඇත. මූලික විද්‍යාවන්ගේ උපත සහ 'අන්වීක්ෂය' සොයාගැනීමෙන් අනතුරුව ඇතිවූ ජීව විද්‍යාත්මක සොයාගැනීම්වල උපයෝගීත්වයෙන්, පසු කලෙකදී, කුර්ආනයේ සඳහන් මෙම කරුණු වල ගැඹුරු බව අවබෝධ කර ගැනීමට මිනිසාට හැකියාව ලැබුණි. 7 වන සියවසේ මුල්භාගයේ ජීවත් වූ මිනිසෙකුට මෙවැනි ඉතා සංකීර්ණ හා නිවැරදි කරුණු පැහැදිලි කිරීම් ඉදිරිපත් කිරීම කිසිසේත්ම කළ නොහැක්කකි.

මැද පෙරදිග හෝ අරාබියේ විසූ මිනිසුන්, යුරෝපීය හෝ අන්‍ය ජාතීන් විසින් මේ විෂයය සම්බන්ධයෙන් දැන සිටි කරුණු වලට වඩා වැඩි යමක් දැන සිටි බවට කිසිම ආකාරයක ඓතිහාසික සඳහනක් අපට දක්නට නොමැත. අද කුර්ආනය හා ස්වභාවික විද්‍යාවන් පිළිබඳව නිපුණ දැනුමක් සහිත බොහෝ මුස්ලිම්වරුන් විසින් මානව ප්‍රජනනය සම්බන්ධව කුර්ආනයේ එන කරුණු හා නූතන විද්‍යාත්මක සොයාගැනීම් අතර පුදුම උපදවන සුළු සමානත්වය පැහැදිලිව ඔප්පු කර ඇත.

18 වියැති සෞදි අරාබියේ හැදී වැඩුණු මුස්ලිම් තරුණයෙකු මානව ප්‍රජනනය පිළිබඳව මා හා කළ ප්‍රකාශය මෙහිදී මට නිරන්තරයෙන්ම සිහියට නැගේ. ඔහු කුර්ආනය ගෙනහැර දක්වමින් මේ පොත අපට මේ විෂයය සම්බන්ධ අත්‍යවශ්‍ය සියළු තොරතුරු ලබා දී ඇත. මා පාසල් යන අවධියේදී මගේ ගුරුවරුන් දරුවෙකු උපදින්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට කුර්ආනය උපයෝගී කරගන්නා ලදී. ඔබේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ පොත් (බටහිර ලිංගික අධ්‍යාපනය පිළිබඳව වූ ග්‍රන්ථ) මේ කරුණු සම්බන්ධයෙන් සිටින්නේ පසු පසිනි".

ප්‍රජනනය පිළිබඳව කුර්ආනයේ දැක්වෙන සියළු කරුණු සවිස්තරාත්මකව මෙහි හුවා දැක්වීමට මා උත්සාහ දැරුවහොත්, සිදුවනුයේ මෙම කුඩා පොත්පිංච මහා ග්‍රන්ථයක් බවට පරිවර්තනය වීමයි. 'බයිබලය, කුර්ආනය සහ නූතන විද්‍යාව' නම් මාගේ ග්‍රන්ථයෙහි, මේ සම්බන්ධ සවිස්තර විද්‍යාත්මක පැහැදිලි කිරීම්, සරල භාෂා විලාශයකින් ඉදිරිපත් කර ඇති අතර, එය අරාබි බස නොදත් හෝ කළල විද්‍යා විෂයය ගැන නොදත් ඕනෑම අයෙකුට කුර්ආනයේ මේ සම්බන්ධව ඉදිරිපත් කර ඇති කරුණු, නූතන විද්‍යාත්මක දැනුම ඇසුරින් සරලව හා වටහා ගැනීමට පහසු අයුරින් ඉදිරිපත් කර ඇත.

කුර්ආනය ලොව පහළ වූ අවධියේ මිනිසා තුළ වූ විශ්වාසයන් ගැන සලකා බැලීමේදී කුර්ආනයේ එන මෙම නූතන විද්‍යාව හා බෙහෙවින්ම සැසඳෙන, විද්‍යාත්මකව පිළිගත හැකි කරුණු අප සැම මවිතයෙන් මවිතයට පත්කරවීමට සමත්ය. කුර්ආනය පහළ වූ අවධියේ මේ විෂයය සම්බන්ධයෙන් මිනිසා තුළ වූ කිසිදු වැරදි, මිථ්‍යා අදහසක් කුර්ආණයෙහි සඳහන් නොවීමද මෙහි ඇති තවත් වැදගත් සලකා බැලිය යුතු කරුණකි.

## සංසේචනය

අපි දැන් 'ශුක්‍රාණුවක (පුරුෂ බීජයක) ඇති සංකීර්ණතාවය සහ සංසේචනය සඳහා ඉතා සුළු ප්‍රමාණයක ශුක්‍රධාතු ප්‍රමාණයක් සෑහීම' යන කරුණු සම්බන්ධයෙන් කුර්ආනයේ සඳහන් දෑ වෙන් වශයෙන් සලකා බලමු. මෙය 'අල්-ඉන්සාන්' පරිච්ඡේදයේ දැක්වේ.

**"සැබැවින්ම මා මිනිසා මැවූයේ ඉතා සුළු ප්‍රමාණයක සම්මිශ්‍රිත තරලයකිනි"**

**(ශු: කුර්ආනය: 76-2)**

'nutfah' යන අරාබි වදන 'සුළු ප්‍රමාණයක්' ලෙස මෙහිදී පරිවර්තනය කර ඇත. එය වැගිරීම, කාන්දුවීම යන අරුත් ඇති ක්‍රියාපදයෙන් බිඳී එන අතර බාල්දියක ඇතිදෑ හිස් කළ පසුව එහි අඩිය මත ඉතිරි වී ඇති ද්‍රව්‍ය යන්න විස්තර කිරීමට විශේෂණ පදයක්

ලෙසද යොදා ගැනේ. ඉහත දැක්වූ කුර්ආනීය වගන්තියෙන් සංසේචනය සිදුවීමට භාවිතා වනුයේ ඉතා කුඩා තරල ප්‍රමාණයක් පමණක් බව ඉතා පැහදිලිව සඳහන් වේ.

තවද 'amshaaj' නම් අරාබි වදන 'සම්මිශ්‍රිත තරලය' ලෙස පරිවර්තනය කෙරෙන අතර, එය අතීතයේ පටන් විස්තර විචාරකයින් විසින් ස්ත්‍රී සහ පුරුෂ ශ්‍රාවයන්ගේ මිශ්‍රණයක් ලෙස පැහැදිලි කර ඇත. එසේ වුවද නූතන සංස්කාරක වරුන් විසින් එය නොයෙකුත් ද්‍රව්‍යයන්ගෙන් සමන්විත වූ 'ශුක්‍ර තරලය' ලෙස නිවැරදිව විස්තර කරයි.

ශුක්‍ර තරලය - වෘෂණ කෝෂ, ශුක්‍ර ආශයිකා, ප්‍රොස්ටේට ග්‍රන්ථිය සහ කූපර් ග්‍රන්ථිය යන කොටස් වලින් නිකුත් කරනු ලබන ශ්‍රාවයන්ගෙන් සමන්විත වේ.

සංසේචන තරලය විවිධ ද්‍රව්‍යයන්ගෙන් සමන්විත වන බව දක්වන කුර්ආනය අනාගත ප්‍රජනිතයින් බිහිවනු ලබන්නේ මෙම තරලයෙන් උකහාගත් යම් කොටසකිනැයි 'අස්-සජ්දාහ්' පරිච්ඡේදයේදී හෙළිකරයි.

**"ඉතින් ඔහු මිනිසාගේ දරු පරපුර නොසැලකිය හැකි තරම් සුළු තරල ප්‍රමාණයකින් උකහාගත් සාරයෙන් ඇතිකරන ලදී"**

**(ශු: කුර්ආනය: 32-8)**

Sulaalah යන අරාබි වදන 'සාරය' ලෙස පරිවර්තනය කෙරෙන අතර එහි නියම අර්ථය වනුයේ "යමකින් පෙරාගනු ලැබූ එහි අඩංගු හොඳම කොටස" යන්නයි. කුමන ආකාරයකින් එය පරිවර්තනය කළද එය යමකින් ලබාගත් කුඩා කොටසක් ලෙස පෙනී යයි. සාමාන්‍ය තත්ත්වයන් යටතේදී ලිංගික සංසර්ගයේ යෙදෙන මිනිසෙකු විසින් පිටකරනු ලබන මිලියන 50 කට අධික වූ ශුක්‍රානු අතුරින් ස්ත්‍රී ඩිම්බයක් (ස්ත්‍රී ඩිම්බ කෝෂ මගින් නිකුත් කරන ඩිම්බ සෛලය හෙවත් 'බිත්තරය') සමඟ සම්බන්ධවීමට හැකියාවක් ලැබෙනුයේ එක් ශුක්‍රාණුවකට පමණි.

## අධිරෝපණය

ස්ත්‍රී ශරීරය තුළ පිහිටි පැලෝපීය නාල තුළදී සංසේචනය වූ ඩිම්බය (බිත්තරය) හෙවත් අණ්ඩ සෛලය ක්‍රමයෙන් එම නාල තුළින් පහතට සංක්‍රමණය වී ගර්භාෂය තුළ තැන්පත් වේ. මෙම ක්‍රියාවලිය 'කළලයේ අධිරෝපණය' ලෙස හඳුන්වනු ලැබේ. අධිරෝපණය සිදුවනුයේ කළලයෙන් (ඩිම්බය හා ශුක්‍රාණුව එක්වීමෙන් සැදුණු යුක්තාණුව විකාශණය වීමෙන් සැදුණු ව්‍යුහය කළලය නම් වේ)

පිටතට වර්ධනය වන ක්ෂුද්‍ර අංගුලිකා නමැති ප්‍රසර විශේෂයක් හේතුවෙනි. (මේවා පසුව කළල බන්ධයන් බවට වැඩි දියුණු වේ.) මෙම ප්‍රසර ගසක් එහි මුල් මගින් පොළවට සවිවී ඇති අයුරින්ම කළලය ගර්භාෂ බිත්තියට දැඩිව සවිකර තබමින් ගර්භාෂ බිත්තිය තුළින් වැඩෙන කළලයට අවශ්‍ය පෝෂණ ද්‍රව්‍යයන් උකහා දෙනු ලබයි. මෙම අධිරෝපණ ක්‍රියාවලිය කුර්ආනයේ බොහෝ කොටස්වල ඉතා යෝග්‍ය ආකාරයෙන් විස්තර කෙරේ. 'අලක්' යන පරිච්ඡේදයම මෙම තේරුමින් නම්කර ඇත.

"**දෙවියන් වහන්සේ මිනිසුන් නිර්මාණය කර ඇත්තේ ආසක්ත ව්‍යුහයකිනි**."

**(ශු: කර්ආනය: 96-2)**

'alaq' යන අරාබි වදනෙහි මූලික/ප්‍රධාන තේරුම වූ 'ආසක්ත ව්‍යුහය' යන්න හැරුණු විට වෙනත් සුදුසු පරිවර්තනයක් මෙහිදී යෙදිය හැකි'යැයි මම නොසිතමි. මෙහිදී මහාචාර්ය හමිදුල්ලාහ්ගේ පරිවර්තනයේ මෙය 'රුධිර කැටියක්' ලෙස දක්වා තිබීම සාවද්‍ය වූවකි. 'රුධිර කැටිය' යන්නද මෙම වදනින්ම ව්‍යුත්පන්න වූ අදහසක් වුවද මෙම වගන්තියේදී එය භාවිතා කිරීම යෝග්‍ය නොවේ.

## කළලය

මවගේ දේහයේ ගර්භාෂය තුළ කළලයේ සිදුවන පරිණාමය පිළිබඳව කුර්ආණයේ ඉතා කෙටියෙන් විස්තර කර ඇති නමුදු එයඉතා නිවැරදි වූවකි. එහි සරල වචන භාවිතයෙන් දක්වා ඇති

සියළු දෑ කළලයේ වර්ධනය සම්බන්ධව වූ මූලික වර්ධක අවධීන් හා මනාව සැසඳේ. 'අල් මුඃමිනූන්' පරිච්ඡේදයේදී අප කියවනු ලබන්නේ මෙම කරුණුය.

**"මවිසින් නිර්මාණය කරන ලද ආසක්ත ව්‍යුහය, හපයක් බඳු මාංශ ගුලියක් බවට පත්කර, ඉන්පසු ඒ තුළින් අස්ථීන් නිර්මාණය කර, එම අස්ථීන් මාංශ පේශීන්ගෙන් ආවරණය කර ආරක්ෂා කළෙමි."**

**(ශු: කු: 23-14)**

'හපයක් බඳු මාංශ ගුලිය' යන හැඳින්වීම (mufghag) මිනිස් කළල විකසණයෙහි එක් මුල් අවධියක පෙනුම විස්තර කිරීමට සැබැවින්ම යෙදිය හැක. එසේම අස්ථි වර්ධනය සිදුවනුයේ මෙම අවස්ථාවේ මෙම ව්‍යුහය තුළය. තවද මෙසේ සෑදෙන අස්ථීන් පසුව මාංශ පේශීන්ගෙන් ආවරණය වීමද සිදුවේ. lahm හෙවත් 'ආවරණ මාංශ' ලෙස කුර්ආනයෙහි මෙය දක්වා ඇත.

කළල විකසනයේ ඇතැම් අවධිවලදී සමහරක් අවයව කොටස් එයින් ඇතිවන අනාගත ජීවියාගේ දේහයේ ඇති ආකාරයට ප්‍රමාණාත්මක සබඳතාවයන් සහිතව වර්ධනය වන අතර, තවත් සමහර විකසන අවධිවලදී මෙය ප්‍රමාණාත්මකතාවයෙන් ඈත්ව පවතී. මෙය කුර්ආනයෙහි 'අල්හජ්' පරිච්ඡේදයෙහි දැක්වේ.

මස් ගුලියක් හා වෙළී පැවති ද්‍රව්‍යයක් බවට ප්‍රමාණාත්මකව හා ප්‍රමාණයෙන් පිට අප මිනිසා නිර්මාණය කලෙමු.

**"මම මිනිසා නිර්මාණය කිරීමට යොදගත් ආසක්ත ව්‍යුහය මස් ගුලියක් බවට හරවා ඉන්පසු එය ප්‍රමාණාත්මකව හා ප්‍රමාණාත්මක නොවන පරිදි සැකසූවෙමි."**

**(ශු: කුර්ආනය: 22-5)**

මීළඟට සංවේදනයන් ඇතිවීම හා අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ව්‍යුත්පන්න වීම සම්බන්ධව 'අස්-සජදාහ්' පරිච්ඡේදයේ දැක්වෙන දෑ සලකා බලමු.

.......... "තවද දෙවියන් වහන්සේ ඔබට කන්, ඇස් සහ හෘදය නියම කළේය"

(ශු: කුර්ආනය: 32-9)

මෙහි සඳහන් කිසිවක් අද අප දන්නා දත්ත හා පරස්පර විරෝධී ඒවා නොවේ. එසේම කුර්ආනය බිහිවූ අවධියේ මිනිසුන් තුළ වූ දුර්මත කිසිවක්ද එහි අන්තර්ගත නොවේ. මධ්‍යතන යුගයේදී මානව වර්ධනය පිළිබඳව විවිධාකාරයේ මිථ්‍යා හා අනුමාන මත පදනම් වූ විශ්වාස බොහෝ පැවති අතර ඒවා එම යුගයේ සිට ශතවර්ෂ ගණනාවක් ඉදිරියට වූ කාලය පුරාද එලෙසම මිනිසුන් තුළ පැවතුණි. ඉතිහාසය ගැන සලකා බලන විට කළල විද්‍යාව සම්බන්ධව එහි ඉතාමත් මූලික, ප්‍රාථමික අවධිය ආරම්භ වනුයේ 1651 දී 'විලි යම් හාවි' විසින් 'ජීවය මූලාරම්භය ලබනුයේ බිත්තරයක් තුළිණි' යැයි කළ ප්‍රකාශයත් සමඟය.

(විලියම් හාවි (1578-1675) ඉංග්‍රීසි ජාතික වෛද්‍යවරයෙකු වූ අතර 'රුධිර සංසරණය' පිළිබඳව නිවැරදි අදහස් හා හෘදයේ නියම ක්‍රියාකාරිත්වය රුධිරය පොම්ප කිරීම වශයෙන් මුල්වරට ලොවට හඳුන්වා දුන්නේ ඔහු විසිනි).

(නව බ්‍රිතාන්‍ය විශ්ව කෝෂය - 5 වෙළුම - පිටු අංක 734)

මෙම අවධිය වන විට අන්වීක්ෂයේ සොයාගැනීම තුළින් විද්‍යාව විශාල දියුණුවක් ලබා තිබුණද, ඩිම්බය හා ශුක්‍රාණුවෙහි ක්‍රියාකාරීත්වයන් පිළිබඳව මිනිසුන් අතර නොයෙකුත් තර්ක විතර්ක හටගෙන තිබුණි. 'බෆන්' නමැති ශ්‍රේෂ්ඨ ස්වභාව විද්‍යාඥයා 'ඩිම්බ න්‍යාය' නම් මතවාදය මුල්වරට ඉදිරිපත් කළ අතර 'බොනට්' විසින් එයට සහයෝගය දක්වමින් 'ඒව්ගේ ඩිම්බකෝෂය' නම් වූ වාදයක් ගෙනහැර දැක්වීය. මෙහිදී ඒව් මානව වර්ගයාගේ මව ලෙස සැලකූ අතර, ඇයගේ දේහය තුළ සියළු මිනිසුන්ට අදාල බීජයන් සියල්ල එකක් තුළ එකක් වශයෙන් ගොණුකර ගබඩා කර තිබුණි යැයි ඔවුහු පවසති.

# බයිබලය, කුර්ආනය සහ විද්‍යාව

මෙම පොත් පිංචෙහි ම විසින් ඉදිරිපත් කිරීමට යෙදෙන අවසාන මාතෘකාවට අප දැන් එළැඹ ඇත. මෙහිදී නූතන විද්‍යාව සමඟ කුර්ආනයේ සහ බයිබලයේ එන කරුණු සංසන්දනය කිරීමට මම කැමැත්තෙමි.

## මැවීම

විශ්වයේ මැවීම පිළිබඳව සාකච්ඡා කිරීමේදී විද්‍යාව හා ආගමික ග්‍රන්ථයන් අතර වූ සමානතා හා පරස්පර විරෝධීතා අප මේ වන විට සලකා බලා හමාරය. එහිදී කුර්ආනය හා නූතන විද්‍යාව අතර වූ එකඟතාවයත්, බයිබලයේ සඳහන් කරුණු වල ඇති පිළිගත නොහැකි භාවයත් ගැන මම පැහැදිලිවම අවධාරණය කළෙමි.

බයිබලයේ එන මැවුම් සම්බන්ධ කොටස් රචනා කරන ලද්දේ ක්‍රිස්තුපූර්ව හයවන සියවසෙහි විසූ පූජකවරයන් විසින් බැවින් මෙය පුදුමයට කරුණක් නොවේ.

මෙය හැඳින්වීමට 'සැසඩෝටල්' හෙවත් 'පූජකවරය' යන ව්‍යවහාරය නිළ වශයෙන් යොදා ගැනීමට යෙදුනේ මේ හේතුවෙනි. මෙහි එන කථා මගින් පෙනෙනුයේ එය බිහිවූයේ මිනිසුන් 'සබත්' හෙවත් සතියේ මුල්දින ආගමික වතාවත්වල යෙදීම සම්බන්ධව අනුශාසනා කිරීම උදෙසා සකස් කෙරුණු ධර්ම දේශණාවකින් බවයි. මෙම කථාව ගොතා ඇත්තේ දර්ශණයන්ට නියත අවසානයක් තබමින් වන අතර 'ඩි වුක්ස්' පියතුමා (ජෙරුසලමේ පිහිටි බයිබල් පාසලේ ප්‍රධානියා ලෙස කටයුතු කළ) පවසන පරිදි මෙම අන්තය අනිවාර්‍ය වශයෙන්ම නීත්‍යාණුකූල වූවකි.

බයිබලයෙහි 'යහ්විස්ට්' අනුවාදයෙහි මීට වඩා කුඩා සහ පැරණි මැවුම් පිළිබඳ කථාවෙක මෙම විෂයය සම්බන්ධයෙන් මීට

හාත්පසින්ම වෙනස්වූ කෝණයකින් කරුණු විග්‍රහ කෙරේ. මේවා උත්පත්ති පොතෙහි Pentateuch හෝ Torah හි පළමු වන උත්පත්ති පොතෙන් ලබාගෙන ඇත. මෝසස් මෙහි කතුවරයා ලෙස සැලකෙන නමුදු අද අපට දක්නට ලැබෙනුයේ විවිධ විශාල වෙනස්කම් වලට භාජනයවූ සංස්කරණයන් පමණි.

බයිබලයේ 'උත්පත්ති' පොතෙහි එන 'පූජක අනුවාදයන්' ආදම් වෙතට නැවත ගමන්කරන හිතුවක්කාර පරම්පරාවක් සම්බන්ධව ප්‍රසිද්ධියක් උසුලන අතර, එය කිසිවෙකු සැලකිල්ලට ගනු නොලබන කථාවකි. ඒ කෙසේ වුවද, 'ශුභාරංචියෙහි' කතෘවරුන් වන මැතිවූ සහ ලූක් විසින් මේවා නැවත ඉදිරිපත් කර ඇත. ජේසුගේ පරම්පරාව යම්තාක් දුරට වචනයෙන් වචනයටම ඉදිරිපත් කර ඇත. මැතිව් හි මෙය ඒබ්‍රාහිම් දක්වා විහිදෙන අතර ලූක් හි එය ආදම් දක්වා විහිදේ. මෙම රචනාවන් විද්‍යාත්මකව පිළිගත නොහැකි ඒවාය. මෙයට හේතුව වන්නේ ඔවුන් විසින් දක්වනු ලබන මිනිසා පොළව මත පහල වූ දිනය සහ පෘථිවියේ වයස ගැන අදහස්, නූතන විද්‍යාවේ ඉතා පැහැදිලි නිසැක සොයාගැනීම් හා සම්පූර්ණයෙන්ම පරස්පර විරෝධී වීමයි. මෙවැනි දින ප්‍රකාශ කිරීම් කුර්ආනයේ දක්නට නොලැබේ.

මීට ඉහතදී විශ්වය සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කිරීමෙහිලා කුර්ආනය නූතන විද්‍යාව හා කෙතරම් හොඳින් ගැලපේදැයි අපි දුටුවෙමු. තවද බයිබලයේ එන විස්තර අනුව දැක්වෙන ආදිකල්පිත ජලය සම්බන්ධ කරුණු හෝ ආලෝකය නිපදවනු ලබන තාරකා මැවීමට ප්‍රථම පළමු දිනයේ ආලෝකය ඇති කිරීම හෝ පොළව සෑදීමට පෙර එක් සන්ධ්‍යාවක් සහ උදෑසනක් පැවති බව සඳහන් කිරීම, පළමුව 3 වන දිනයේදී පෘථිවිය මවා ඉන්පසු 4 වන දිනයේදී සූර්යයා මැවීම හා 5 වනදින අහසේ කුරුල්ලන් ඇතිකිරීමෙන් අනතුරුව 6 වන දින පොළව මත සිව්පාවුන් ඇති කිරීම යනාදී

බොහෝ කරුණු වලින් පෙනෙනුයේ ඒවායේ ඇති වැරදි අනුපිළිවෙළයි. මේ සියළුම වගන්තීන් බයිබලය සැකසූ අවධියේ මිනිසුන් තුළ තිබූ විශ්වාසයන්ගේ ප්‍රතිඵලය ලෙස සෑදුණු ඒවා හැරෙන්නට වෙන කිසිදු අර්ථයක් ඒවායෙහි අඩංගු නොවේ.

## පෘථිවියේ වයස

බයිබලයේ ඇති ස්වභාවය පිළිබඳ කරුණු මත පදනම් වූ යුදෙව් දින දර්ශණයට අනුව ස්ථිරවම පවසනුයේ අදට පෘථිවියේ වයස වසර 5738 ක් බවයි. නමුත් මෙය කිසිම අයුරකින් හෝ පිළිගත හැක්කක් නොවේ. අපගේ සෞරග්‍රහ මණ්ඩලය ආසන්න වශයෙන් වසර බිලියන 4.25 ක වයසකින් යුක්ත වන අතර මුල්ම මිනිසා ලොව පහළ වූ කාලය ලෙස අද දක්නට ලැබෙන පරිදි අවම වශයෙන් අදින් වසර $10^{1000}$ කට පෙරයැයි විශ්වාස කරනු ලැබේ. කුර්ආනයේ පෘථිවියේ වයස හෝ මිනිසා ලොව පහල වූ දිනය ගැන කිසිඳු සඳහනක් නොකෙරෙන අතර එය බයිබලයටම පමණක් ලාක්ෂණික වූවකි.

## ගංවතුර

දෙවනුව බයිබලය හා කුර්ආනය සැසඳීමට යොදගත හැකි තවත් ඉතා වැදගත් මාතෘකාවක් නම් ඒවායේ එන 'මහා ජලගැල්ම' පිළිබඳ විස්තරයන්ය. බයිබලයේ මේ ගැන කෙරෙන සඳහන් එකිනෙකට වෙනස් වූ සිද්ධීන් 2ක් එක්කර දැක්වීමකි. බයිබලයේ දැක්වෙන පරිදි මෙය මුළු ලෝකයටම පොදු වූ ගංවතුරක් වූ අතර එය දළ වශයෙන් ඊබ්‍රාහීම්ගේ [තුමා] කාලයෙන් වසර 300 කට පෙරදී ඇතිවුණි. අප ඊබ්‍රාහීම් ගැන [නබිතුමන්] දන්නා කරුණු අනුව මෙම මහා ලෝක විනාශය සිදුවූයේ ක්‍රි. පූ. 21 වන හා 23 වන ශතවර්ෂ අතරතුර කාලයකදීය. මේ අනුව අද අප සතුව ඇති ඓතිහාසික දත්ත පදනම් කරගෙන බයිබලයේ එන මෙම කථාව පිළිගත නොහැක්කක් ලෙස සැලකීමට සිදුවේ.

ඊජිප්තුවේ මධ්‍යම රාජධානිය තුළ එකොළොස්වන රාජ පෙළපත ආරම්භ වීමට පෙරාතුව පැවති ප්‍රථම අන්තර්මාධ්‍ය කාලය ලෙස දළ වශයෙන් ගැනෙන ක්‍රි. පූ. 21 වන සියවස හෝ ක්‍රි. පූ. 22 වන සියවසේදී ලෝක විනාශයක් මගින් සියළු ශිෂ්ඨාචාර මිහිමතින් තුරන් වූ බව අප විශ්වාස කරන්නේ කෙසේද?

මේ වකවාණුව තුළදී මුළු මිනිස් සංහතියම මිහිමතින් තුරන් වූ බව ඓතිහාසික වශයෙන් පිළිගත නොහැක්කකි. නූතන විද්‍යාවට අනුවද මෙම විස්තරයන් සියල්ල ප්‍රතික්ෂේප වේ. මේ අනුව සලකා බලන විට බයිබලය හා කුර්ආනයෙහි අතර ඇති අති විශාල පරතරය අපට මැනගත හැකිවනු ඇත.

බයිබලයෙහි මෙන් මේ මහාගංවතුර ලෝක විනාශයක් ලෙස හඳුන්වා නොදෙන කුර්ආනය එය නූහ් (තුමා)ගේ මිනිසුන් සඳහා පමණක් සීමාසහිත වුවක් බවට කරුණු දක්වයි. නූහ්ගේ මිනිසුන් සහ අනෙකුත් භක්තියකින් තොර වූ අදේවවාදීන් හා දුෂ්ඨ පුද්ගලයින් සියල්ලෝම ඔවුන්ගේ පවුවලට නිසි දඬුවම් ලැබූහ. වාස්තු විද්‍යාත්මක වශයෙන් හෝ ඓතිහාසික වශයෙන් හෝ මෙම කුර්ආනීය කථාවට පටහැනි කිසිදු සාධකයක් අපට දැකගත නොහැක.

## ෆේරෝහ්

තුන්වැනිව තවත් අතිශය වැදගත්වූ කරුණක් වන මෝසස්ගේ කථාව සලකා බලමු. යුදෙව්වන් ඊජිප්තුවෙන් නික්ම යෑම ගැන නික්මයාම, නම් බයිබලයේ පරිච්ඡේදය ඇසුරින් සාකච්ඡා කරමු. මෙහිදී මා හට මෙම කරුණ යටතේ ඉදිරිපත් කළ හැක්කේ මාගේ අධ්‍යයනයන්ගේ සංක්ෂිප්තයක් පමණි. බයිබලයේ හා කුර්ආනයේ එන කරුණු අතර ඇති එකිනෙකට ගැලපෙන කරුණු සහ එකිනෙකට පටහැණි කරුණු මෙහිදී අවධානයට යොමුවිය. එසේම මෙහිදී මෙම ග්‍රන්ථ දෙක එකිනෙක හා ප්‍රයෝජනවත් වන ආකාරයකින් උපපූරණය කරන අවස්ථාද මට දක්නට ලැබුණි.

ෆේරෝවරුන්ගේ ඉතිහාසයේ 'නික්මයාම' ට අදාල වන ඓතිහාසික කාල වකවානුව පිළිබඳව ඇති බොහෝ කල්පිතයන් අතුරින් වඩාත්ම යෝග්‍ය කාලය ලෙස මවිසින් තෝරාගනු ලැබුයේ ''මෙර්නෙප්තාහ්' හා 'දෙවන රමේසස්ගෙන්' පසු පාලන බලය ලද 'නික්මයාමෙහි සඳහන් වන ෆේරෝගේ සමයයි.

P. Montet විසින් රචිත 'ඊජිප්තුව හා බයිබලය' නම් පොතෙහි මෙය දැක්වේ.

(Delachaux & Niestle, France-1959)

ග්‍රන්ථ දෙකෙහි සඳහන් කරුණු සලකා බැලීමේදී වාස්තු විද්‍යාත්මක සාක්ෂීන් ඉහත උපකල්පනය තහවුරු කිරීමට අනුබල දෙනු ලබයි. බයිබලයේ ඇති කරුණු අනුව මෝසස් ෆේරෝගේ කාලය තුළ විසූ බවට සාක්ෂි දරන බවට මෙහිදී සඳහන් කරනු කැමැත්තෙමි. මෙසේ, දෙවන රමේසස්ගේ පාලන සමය තුළ උපත ලබන්නට ඇත. එබැවින් බයිබලයේ එන දත්ත මෝසස්ගේ කථාව සම්බන්ධයෙන් වැදගත් ඓතිහාසික වටිනාකමකින් යුතු ඒවායි. මෙර්නෙප්තාහ්ගේ බෙහෙත් ගල්වා ආරක්ෂා කරන ලද මලමිණිය (ම/මිය) සම්බන්ධව සිදුකළ වෛද්‍ය පර්යේෂණවලින් ඔහුගේ මරණයට හේතු වූ කරුණ පිළිබඳව ප්‍රයෝජනවත් තොරතුරු හෙළිදරව් වී ඇත.

(බෙහෙත් ගල්වා ආරක්ෂා කරන ලද දෙවන රමේසස්ගේ පුතුවූ 'මෙර්නෙප්තාහ්ගේ මළ සිරුර Loret විසින් 1898 දී 'තීබ්ස්' හි පිහිටි රජවරුන්ගේ නිම්නය' නම් ස්ථානයේදී සොයාගනු ලැබ 'කයිරෝ' නුවරට ගෙනගොස්, 'එලියට් ස්මිත්' විසින් ඔහුගේ සිරුර 1907.07.08 දින විවෘත කර පරීක්ෂා කරන ලදී. මෙම පරීක්ෂණයේ සවිස්තර සටහනක් ඔහු විසින් රචිත 'The Royal Mummies' පොතෙහි සඳහන් වේ.)

මෙම ෆේරෝ මමිය අද අප සතුවීමෙන් අපට ඉතා වැදගත් තොරතුරු එයින් සපයා ගත හැකි වේ. බයිබලයේ මොහු මුහුදේ ගිල්වීමෙන් මියගිය බව සඳහන් කරන නමුදු ඉන්පසුව ඔහුගේ මෘත

ශරීරයට කුමක් සිදුවූයේද යන්න ගැන කිසිවක් සඳහන් නොකරයි. කුර්ආනයේ 'යූනුස්' පරිච්ඡේදයේදී ෆේරෝගේ මල සිරුර ජලයෙන් ගොඩගත් බව සඳහන් වේ.

**"අද දින මම ඔබගේ මලමිණිය රක්ෂා කර තබන්නෙමි. එබැවින් සමහර විට එය ඔබ පසුපස ඔබේ මගෙහි ගියවුනට හොඳ සලකුණක් වනු ඇත."** (ශු: කුර්ආනය: *10 - 92*)

මළසිරුර පරීක්ෂා කළ වෛද්‍යවරුන්ගේ අදහස අනුව මෙම සිරුර ජලයේ බොහෝ වේලා රැඳී නොතිබූ බවක් සඳහන් කරයි. මක් නිසාද යත්, වැඩිකලක් ජලයේ ගිලී පැවතීමෙන් ඇතිවන ක්ෂයවීයාමේ ලක්ෂණ කිසිවක් එම දේහයේ නොතිබුණු බැවිනි. මෙහිදීද කුර්ආනයේ එන කරුණු නූතන විද්‍යාත්මක දැනුම හා කිසිදු පරස්පර විරෝධීතාවයක් ඉතා සුළුවෙන් හෝ නොදක්වයි.

මෙම එකඟතාවය කුර්ආනය සම්බන්ධයෙන්ම පමණක්ම වූ සුවිශේෂතාවයකි. නමුත් විද්‍යාත්මක ඇසින් බලන විට බයිබලයේ දක්නට ලැබෙන සාවද්‍ය කරුණු හේතු කරගෙන යුදෙව් ක්‍රිස්තියානි පහළවීම් දක්වන ආගමික ග්‍රන්ථයන්හි පිහිටි නෛසර්ගික වටිනාකම එය අභිමිකර ලීමට හෝ එය අපකීර්තියට පැමිණවීමට අපි අදහස් නොකරමු. එසේම මා මෙහිදී විවේචනයට ලක්කරන ලද්දේ සම්පූර්ණ ග්‍රන්ථයම නොව එහි ඇති ඇතැම් කොටස් පමණි. බයිබලයේද ඓතිහාසික වශයෙන් වටිනා කොටස් ඇතුලත් වන බව මෙහිලා සඳහන් කරණු කැමැත්තෙමි. මාගේ 'බයිබලය, කුර්ආණය හා විද්‍යාව' නම් පොතෙහි මෝසස්ගේ ජීවිත කාලය සම්බන්ධව බයිබලයේ එන නිවැරදි ඓතිහාසික කරුණු හුවා දක්වා ඇත.

මෙසේ මෙම ශුද්ධ ග්‍රන්ථයෙහි හා නූතන දැනුමෙහි වෙනස්කම් පැවැතීමට හේතුව අද බොහෝ උගතුනට නොරහසකි. බයිබලයේ පැරණි වෙළුම (පැරණි තෙස්තමේන්තුව) බොහෝ වෙනස්වීම් වලට බඳුන් වූවක් වන අතරම එය පුරා ශතවර්ෂ 9 ක කාලයක් මුළුල්ලේ රචිත ලේඛණ සමූහයක එකතුවකින් සමන්විත වන්නකි. මෙහි

වෙනස්කම් ඇතිකිරීම සඳහා ඇතිවූ මිනිස් දායකත්වය බයිබලයේ කැපීපෙනෙන ලක්‍ෂණයකි.

කුර්ආනය පහළවීම සම්බන්ධ ඓතිහාසික කථාව මීට වඩා හාත්පසින්ම වෙනස් වූවකි. අප මේ වන විට දන්නා පරිදි කුර්ආනය ප්‍රථම වතාවට මිනිසාට පහළ වූ මොහොතේ පටන්ම එය කටපාඩමින් මතකයේ රඳවාගත් අතර, මුහම්මද් නබිතුමාගේ (සල්) ජීවිත කාලය ඇතුලතදීම එය ලියා තබන ලදී. මේ හේතුවෙන් කුර්ආනයේ වලංගු භාවය පිළිබඳ කිසිඳු ප්‍රශ්නයක් අද අපට පැන නොනඟී.

මේ මුළු පොත් පිංච පුරාම ඉදිරිපත් කරන ලද කරුණු සියල්ල අනුව පැහැදිලි වන්නේ කුර්ආනය විෂය මූලිකව හා අපක්‍ෂපාතීව, නූතන දැනුම උපයෝගී කරගෙන පරීක්‍ෂා කිරීමේදී, නූතන විද්‍යාව හා කුර්ආනය පැහැදිලිවම එකඟතාවයක් දක්වන බවයි. තවද මුහම්මද් නබිතුමාගේ (සල්) අවධියේ පැවැති දැනුම මට්ටම ගැන සලකා බලන කළ, ඔහු මෙම පොතෙහි කතෘ යැයි කිසිලෙසකිනුත් පිළිගත නොහැක. මේ අනුව සලකා බැලීමේදී කුර්ආනය අනෙකුත් ආගමික හා ආගමික නොවන ග්‍රන්ථ අතර අනගි ස්ථානයක් හිමිකර ගන්නා අතර මෙය භෞතික හෝ ද්‍රව්‍යාත්මක හේතු සාධක මත පදනම් කරගෙන පැහැදිලි කළ නොහැකි බව අපක්‍ෂපාතී විද්‍යාඥයන් විසින් පිළිගනු ලැබේ. මෙවැනි කරුණු මා මෙහිදී සතුටින් ඔබ හමුවේ තබන්නේ කුර්ආනය මිනිස් පැහැදිලි කිරීම් වලට අව්‍යාජ ලෙස අභියෝග කෙරෙන බැවින් අප ඉදිරියේ ඇත්තේ එකම විකල්පයක් පමණි. එනම් කුර්ආනය නිසැක වශයෙන්ම දෙවියන් වහන්සේ විසින් මෙලොව පහල කරවන ලද්දක් යන්න පිළිගැනීමය

# පසු වදන

අද ලොව පවතින නානා ප්‍රකාර ග්‍රන්ථ අතුරින් අති විශිෂ්ඨතම ග්‍රන්ථය කුර්ආනය යැයි යමෙකු පැවසුවහොත් එය කිසිවෙකුටත් හේතු සාධක සහිතව ප්‍රතික්ෂේප කළ නොහැක්කකි. පියවි ඇසට නොපෙනෙන පරමාණුව·මිනිස් කළලය වැනි අංශු මාත්‍ර වස්තූන්ගේ පටන් තාරකා පද්ධති හා විශ්වය බඳු මහා වස්තූන් පිළිබඳව වූ අතිශයින්ම නිවැරදි කරුණු වලින් සමන්විත වන්නා වූ ශුද්ධ වූ කුර්ආනය මේ මිහිමත ඇති අති විශිෂ්ඨතම ග්‍රන්ථය බවට කිසිඳු සැකයක් නැත. එය සාමාන්‍ය මිනිස් නිර්මාණයක් නොව දේව වදනක් වීම මෙම විශිෂ්ඨතාවයට හේතු වේ. ඉස්ලාමය පිළිබඳව වැටහිමක් නොමැත්තෙකුට මෙම කියමන එක්වරම පිළිගත නොහැක්කක් වනු ඇත. (අන්‍ය ලබ්ධිකයෙකුව සිටි මමද වරෙක මෙම අත්දැකිමට මුහුණ පැවෙමි) එනමුත් මෙම පොත් පිංච සම්පූර්ණයෙන් කියවිමෙන් සහ මෙහි අවසානයේ ඉදිරිපත් කර ඇති කුර්ආණීය වගන්තින් තේරුම් ගැනීමෙන් පසුව ඕනෑම පුද්ගලයෙකු එය දේව වදනක් බව පිළිගැනීමට මැලි නොවනු ඇත. ඒ කිසිඳු සාක්ෂයයක් නොමැතිව වුවද, කුර්ආණයේ ඇති අති විශේෂ එයටම ආවේණික වූ ශෛලිය ගැන සිතීමෙන් පමණක් වුවද එය සාමාන්‍ය මිනිස් වදනක් නොවන බවට ඕනෑම අයෙකුට පහසුවෙන් වටහා ගත හැක. මිනිස් සාහිත්‍ය ඉතිහාසය ගැන සලකා බලන කළ විවිධ යුගයන්හිදී විවිධ ජන සමාජයන් තුළ නිර්මාණය වූ සියළු ලිපි ලේඛණ ග්‍රන්ථ ආදී සියල්ලක්ම ඒ යුගයට හාඑම සමාජයට ආවේණික වූ එකම කැපීපෙනෙන ශෛලියක් පවතින බව පෙනී යයි. එසේ වුවද කුර්ආණයේ ඇති භාෂා ශෛලිය හෝ කථා ශෛලිය එය නිර්මිත යුගයේ තබා එදා සිට අද දක්වා බිහිවූ කිසිඳු ග්‍රන්ථයක ශෛලියක් හා සැසඳිය නොහැකි වූ ඒ සියල්ලෙන්ම වෙන්වූ අමුතුම ආරක පුස්ථකයකි. එබැවින් කුර්ආනය වනාහි නිසැක වශයෙන්ම දිව්‍යමය ග්‍රන්ථයකි.

කිසිඳු ආගමක් දහමක් නො අදහන්නෙකු වුවද, සෑම මිනිසෙකුම විද්‍යාත්මක නිර්මාණයක් පිළිබඳව හා නූතන විද්‍යාව

පිළිබඳව ඉතා ඉහලින් සැලකීමට අද පුරුදු වී සිටී. එවන් සමයෙක නූතන විද්‍යාව හා මෙම අතිවිශිෂ්ඨ ග්‍රන්ථය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කිරීම ඇත්ත වශයෙන්ම යුගයේ අවශ්‍යතාවයකි. කෙසේ වුවද අප මෙහිදී තේරුම් ගත යුතු තවත් එක් වැදගත් කරුණක් නම් කුර්ආනය යනු විද්‍යා අත් පොතක් නොව සුවිශේෂ ආගමික ග්‍රන්ථයක් බවයි. මන්ද යත් එහි කරුණු ගොනු කර ඇත්තේ විද්‍යාත්මක තේමා යටතේ නොව ආගමික තේමාවන් යටතේය. එසේ වුවද එහි අද අප දන්නා සෑම විද්‍යා ක්ෂේත්‍රයක් පිළිබඳවම විද්‍යාව කියා යමක් බිහිවන්නටද මත්තෙන් ඉතා නිවැරදිව පැහැදිලි කර ඇති ආකාරය බෙහෙවින්ම චිත්තාකර්ශණීය සහ පුදුම සහගත වූවකි.

විද්‍යාව යනු අප සෑම දන්නා පරිදි නිතිපතා එක්වන නව දැනුම හේතුවෙන් දිනෙන් දින සංශෝධනයන්ට ලක්වන හා දියුණුවට පත්වන විෂය ක්ෂේත්‍රයකි. එය අප වනාන්තර වලින් ගහණ වූ දිවයිනක අළුතින් එලිපෙහෙලි කර ඉදිවූ කුඩා ජනාවාසයකට උපමා කළහොත් එම ජනාවාසයට (එනම් විද්‍යාවට) මුළු දිවයිනම ජනාවාස භූමියක් ලෙස කළ එලි කර ගැනීමට තවත් කාලයක් ගතවනු ඇත. එසේම ජනාවාසයේ පදිංචි කරුවන් එය නොසලකා හරින්නේ නම් එය එතැනින්ම නතරවීමට හෝ ජනාවාසයම විනාශ වී වල්බිහිවී යන්නටද පිලිවන. විද්‍යාවද එබඳුය. ඒ සියල්ලම සිදුවන්නේ දෙවියන්ගේ කැමැත්තට අනුකූලවය. අද අප දන්නා නූතන විද්‍යාවට අනුකූලව කුර්ආනයේ එන දේව වදන්වලින් 80%ක තරම් වූ විශාල ප්‍රමාණයක් 100% ක්ම නිවැරදි යැයි දැනටමත් ඔප්පු වී හමාරය. ඉන් ඉතිරි 20% ද අනාගතයේදී විද්‍යාවේ ඇතිවිය හැකි නව දියුණුව හේතුවෙන් නිරවද්‍ය ලෙස ඔප්පු කිරිමට මිනිසාට හැකිවීමේ සම්භාවිතාවය බෙහෙවින්ම විශාලය. ඉදින් තව දුරටත් අප අඳුරේ ගිලී නොසිට ඉස්ලාමයේ ආලෝකය ලබා දේව ආශීර්වාදය ලබාගැනීමට පසුබට නොවිය යුතුය.

කුර්ආනය පිළිබඳව ඔබට යම් සැකයක් වේ නම්, එහි අල්ලාහ් විසින් ඉදිරිපත් කර ඇති අභියෝගයනට මුහුණදීමට උත්සාහ දැරිය යුතු වේ. ශුද්ධ වූ කුර්ආනයේ 11 වන පරිච්ඡේදයේ 13 වැනි වගන්තියේදී එයට (කුර්ආනයට)සමාන පරිච්ඡේද 10 ක් නිර්මාණය

කරන්නැයි අල්ලාහ් ඔබට අභියෝග කරන අතර 10 වැනි පරිච්ඡේදයේදී (38 වගන්තිය) ඔබට හැකිනම් එක් සූරාවක් (පරිච්ඡේදයක්) නිර්මාණය කරන්නැයි පවසන අතර 2 වැනි පරිච්ඡේදයේදී 23 වන සහ 24 වන වගන්තින්ගෙන් යම් අයුරකින් හෝ කුර්ආණයට සැසඳිය හැකි පරිච්ඡේදයක් නිමවන්නැයි අභියෝග කරති. තවද 4 වැනි පරිච්ඡේදයේ 82 වැනි වගන්තියෙන් කුර්ආණය තුළම එන එකිනෙකට පටහැණිවූ කරුණක් පෙන්වා දෙන ලෙස අල්ලාහ් ඔබට අභියෝග කරති. අති දයාන්විත වූ අල්ලාහ් විසින් ඔබට අභියෝගය ක්‍රම ක්‍රමයෙන් ලිහිල් කර දී ඇතත් මේ අභියෝගය ජයගැනීමට මෙතෙක් කිසිවෙකු සමත් වී නැත. අනාගතයේදී ද එය එසේම වනු ඇත.

අන්‍ය ලබ්ධිකයිනි: අපි ඔබට කුර්ආනය අන්ධ භක්තියකින් පිළිගන්නැයි කිසිවිටෙකත් නොපසවමු. එනමුදු අපි ඔබට එක් ආයාචනයක් කරන්නෙමු. එනම් ඔබ තුළ වූ කිසියම් අන්ධ විශ්වාසයන් හෝ මිත්‍යා මතවාදයන් පදනම් කරගෙන කුර්ආණය ඉවතලීමෙන් ඔබ වැලකී සිටිය යුතුය. දැනුම සොයාගොස්, සත්‍ය වටහාගෙන නිසි අපක්ෂපාති තීරණයකට එළඹීමට ඔබ නිරතුරුවම උත්සාහ ගත යුතුය. ඔබ ඔබේ තීරණයෙහි විනිශ්චයකරු වන්නෙහිය. එනමුදු මරණින් මතු ඔබ ඒ පිළිබඳව දෙවියන් ඉදිරියේ වගකිව යුතු වේ.

විද්‍යාත්මක දියුණුව හා මිනිසාගේ අධ්‍යාත්මික දියුණුව එකිනෙකට ප්‍රතිලෝමව සමානුපාතිකතාවයක් විදහා දක්වන අදවත් යුගයෙක ආගම් පිළිබඳව මිනිස් ඇස යොමවනුයේ ඉතා කලාතුරකකිනි. එසේ වුවද ඕනෑම 'අදේව වාදියෙකු' එසේත් නොමැති නම් සිය ජීවිත කාලය මුළුල්ලෙහිම කිසිඳු ආගමක් නොඇදහූ පුද්ගලයෙකු වුවද තමා යම් විපතකට පත් වූ මොහොතෙක නිරන්තරයෙන්ම ඔවුන්ගේ මනැසට හා මුවහට නැගෙනුයේ 'දේව උපකාර අයැදීම' නොවන්නෙහිද? මෙයින් පැහැදිලි වන්නේ සෑම මිනිසෙකුම තම ජීවිත කාලය තුළදී කිසියම් අවස්ථාවක දෙවියන් පිළිබඳ විශ්වාසයකට එළඹෙන බවයි. එසේ නම් ලොව නන් දෙස විසිරී පැතිරී ඇති විවිධ ආගම්, දර්ශණ පිළිබඳව නිසි අධ්‍යනයක නිරත වී සත්‍ය ආගම කුමක්දැයි වටහා ගැනීමත්, දෙවියවන් පිළිබඳව නිසි අවබෝධයක් ලබාගැනීමත්,

මිනිසත් බව ලබා මෙලොව උපන් සෑම මනුෂ්‍යයෙකු වෙතටම පැවරී ඇති භාරදූර වගකීමකි. වෛද්‍ය මොරිස් බුකායි විසින් සිදුකකරන ලද එබඳු අධ්‍යයනයක සාරාංශයක් මෙම පොත මහින් ඔබ වෙත ඉදිරිපත් කෙරේ. දයාබර පාඨකයෙනි, ඔබ මේ පොත හුදෙක් කියවා සෑහීමකට පත් නොවී ස්වෝත්සාහයෙන් වැඩිදුර අධ්‍යයනයන්හී නිරත වී නිසිමඟට අවතීර්ණ වන්නේ නම් ඒ අපේ අරමුණු සාක්ෂාත් වීමකි.

අනොරක් නොමැතිව ලොව සිව්දිගින් නිතිපතා අප සවනත වැකෙන 'යුධබිය', අසමගිය හා විනාශය' පිළිබඳව මඳකට හෝ ඔබ ඔබේ සිත යොමුකර බැලුවෙහිද? මේ සියල්ලටම හේතුවුයේ කුමක්ද? එක් මිනිසකු, තවෙකකු අභිබවා යමින්, හිංසා පීඩා කරමින් සතුටු වන්නට තරම් මිනිසා කුරිරු වීමට හේතු වූයේ කුමක්ද? ඒ අන් කිසිවක් නොව මිනිසා නිසා ආගමික අධ්‍යාපන ක්‍රමයන්ගෙන් ඉවත්ව යාමේ ප්‍රතිඵලයකි. ඉතින් සාමය අගයන සහෝදර සහෝදරියනි, ඔබ තවමත් පමා වූවා වැඩි නැත. කල් ඉක්මයාමට පෙර ඔබෙන් ඔබටත් - ලොවටත් ඉටුවිය යුතු යුතුකම් ඉටු කිරීමෙහි නියැලෙන්න! ඔබට ඒ සඳහා අල්ලාහ්ගේ අශිර්වාදය ලැබේවා

න ජ් මා පෙ රේ රා සිංහල භාෂා පරිවර්තක
ජුනි 98
බහරේන්

සැ.යු. මෙම පරිවර්තනයෙහි ඇති අඩුලුහුඩු කම් හෝ මේ පිළිබඳව යෝජනා, චෝදනා හෝ සංශෝධන වේ නම් එය පහත ලිපිනයට යොමුකරන ලෙස සියළුම පාඨකයින්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

SIS.NAJMA PERERA
DISCOVER ISLAM
P.O. BOX 10901
MANAMA, BAHRAIN.

"සියළු පැසසුම් සියලු ලෝක වලට අධිපති වූ දෙවියන්ටම වේවා"

# අවධානයට ලක්විය යුතු කුර්ආණීය වගන්ති කිහිපයක් .....

1. කුර්ආණය දේව වදනකි යන්න පිළිබඳව කුර්ආණීය සාක්ෂිය
   * පරිච්ඡේද අංක 32 - 1, 2, 3 වැකි
   * පරිච්ඡේද අංක 45 - 1, 2, 3, 4, 5, 6 වැකි
   * පරිච්ඡේද අංක 2 - 79
   * පරිච්ඡේද අංක 7 - 184
   * පරිච්ඡේද අංක 68 - 2
   * පරිච්ඡේද අංක 81 - 22
   * පරිච්ඡේද අංක 29 - 48
   * පරිච්ඡේද අංක 6 - 92
   * පරිච්ඡේද අංක 12 - 1, 2
   * පරිච්ඡේද අංක 27 - 6
   * පරිච්ඡේද අංක 32 - 1, 3
   * පරිච්ඡේද අංක 36 - 1, 2, 3
   * පරිච්ඡේද අංක 39 -1
   * පරිච්ඡේද අංක 40 -2
   * පරිච්ඡේද අංක 45 - 2
   * පරිච්ඡේද අංක 35 - 1,2
   * පරිච්ඡේද අංක 56 - 77 - 80
   * පරිච්ඡේද අංක 76 - 23

2. කුර්ආණය දේව වදනක් බව නොපිළිගත්තවුන් සඳහා අභියෝග
   * පරිච්ඡේද අංක 52 - 34 වැකිය
   * පරිච්ඡේද අංක 11 - 13
   * පරිච්ඡේද අංක 10 - 38
   * පරිච්ඡේද අංක 2 - 23, 24
   * පරිච්ඡේද අංක 4 - 82

3. තාරකා විද්‍යාව
   * පරිච්ඡේද අංක 21 - 30 වැකිය
   * පරිච්ඡේද අංක 31 - 29

* පරිච්ඡේද අංක 39 - 5
* පරිච්ඡේද අංක 41 - 11
* පරිච්ඡේද අංක 25 - 61
* පරිච්ඡේද අංක 79 - 30
* පරිච්ඡේද අංක 86 - 3
* පරිච්ඡේද අංක 21 - 33
* පරිච්ඡේද අංක 36 - 40, 38
* පරිච්ඡේද අංක 13 - 2
* පරිච්ඡේද අංක 35 - 13
* පරිච්ඡේද අංක 51 - 47

4. භෞතික විද්‍යාව (Physics)

පරි. අංක - 34 - 3
10 - 61

5. භූගෝල විද්‍යාව හා ජලවිද්‍යාව (Geography & Hydrology)

පරි. අංක 39 - 21
30 - 24
23 - 18
15 - 22
24 - 43
78 - 12, 13, 14
30 - 40
24 - 43
3 - 9
7 - 57
13 - 17
25 - 48, 49
35 - 9
36 - 34
45 - 5
50 - 9, 10
56 - 68/70
67 - 30

6. භූගර්භ විද්‍යාව (Geology)

පරි. අංක - 76 - 6, 7 වැනි
88 - 19
79 - 32
21 - 31
31 - 10
16 - 15

7. සමුද්‍ර විද්‍යාව (Oceanology)

පරි. අංක - 25 - 53
55 - 19,20
24 - 40

8. ජීව විද්‍යාව (Biology) /සත්ත්ව විද්‍යාව (Zoology)

පරි. අංක - 21 - 30
24 - 45
25 - 54
6 - 38
16 - 79
67 - 19
16 - 68, 69
29 - 41
27 - 17,18

උද්භිද විද්‍යාව (Botany)

පරි. අංක - 20 - 53
13 - 3

9. වෛද්‍ය විද්‍යාව - (Medicine)

පරි. අංක - 16- 68, 69 වැනි
16 - 66
23 - 21
96 - 1, 2
4 - 56

10. කායික විද්‍යාව (Physiology)
පරි. අංක - 23 - 21
16 - 66
75 - 3, 4

11. කළල විද්‍යාව - (Embryology)
පරි. අංක - 25 - 59
96 - 1, 2
86 - 5, 7
23 - 13
22 - 5
32 - 8, 9
76 - 2
39 - 6
53 - 45, 46
75 - 37, 38, 39
23 - 12, 13, 14
75 - 3, 4
4 - 54, 56
41 - 53

12. ජාන තාක්ෂණය/ප්‍රවේණි විද්‍යාව - (Genetics)
පරි. අංක - 53 - 45, 46
75 - 37,39
23 - 12, 14
22 - 5
40 - 67
75 - 38
80 - 19,20
96 - 5
32 - 9
76 - 2